# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 නොවැම්බර් 05 වන අඟහරුවාදා**
2013 நவம்பர் 05 செவ்வாய்க்கிழமை
Tuesday 05th November 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல. 204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.45 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.45 க்கு சபை கூடியது*
The Provincial Council met at 09.*45* a.m.

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදනය
## ANNOUNCEMENT OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"2014 වර්ෂයේ මුදල් ප්‍රකාශය සම්බන්ධ වැඩ කටයුතු සඳහා දින වෙන් කර ගැනීම පිළිබඳව 2013.10.22 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එකඟතාවයන් කිහිපයකට එළඹිණි. ඒ අනුව අද දින න්‍යාය පත්‍රයේ සභා රැස්වීම ශීර්ෂයය යටතේ යෝජනාවන් කිහිපයක් ඇතුළත් වන අතර අදාළ අවස්ථාවන්හිදී එම යෝජනා පිළිබඳව නිශ්චිත තීරණයක් ඔබතුමන්ලාගෙන් මම බලාපොරොත්තු වන බව කාරුණිකව දැනුම් දෙනවා.*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2013.10.22 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that copies of the relevant report are placed on the tables of Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ගරු සභාපතිතුමනි, කැලණිය, පටිය හන්දිය, දුම්රිය පොළ පාර, අංක 73/5 හි පදිංචි පී.ඒ.ඩී.එස්.ටී. සිරිවර්ධන යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petition Presented, ordered to refer to the Petitions Committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

***න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, එතුමා වෙනුවෙන් ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***
*The question in the name of the Hon.. Sirikamal Felician De Silva, - Member, under item No. 01 in the agenda was presented to the Hon. Health Minister and as two weeks time was asked for it by the Hon. Chief Minister, Mr Prasanna Ranatunga on his behalf, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

# නොපැමිණ සිටීමේ අවසරය
## LEAVE OF ABSENCE

**ගරු සේනක දමයන්ත ද සිල්වා**
Hon. Senaka Damayantha de Silva

ගරු සභාපතිතුමනි, *"විජිත් ප්‍රියන්ත ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි ඉල්ලා සිටිනවා."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to*

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි,මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මැදිහත් වීම සිදු වෙයි කියලා මේ අවස්ථාවේ දී බලාපොරොත්තු වෙනවා. රතුපස්වල සිද්ධියත් මේ වගේමයි. මම මීට කලින්ම ඒ පිළිබඳව කථා කළා. මගේ කථාව ගණන් ගත්තේවත් නැහැ. ඇත්තටම පළමුවෙන්ම ජනමාධ්‍යයට ගියේ ඒකයි. වැරැද්දක් කියනවා නොවෙයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමා රතුපස්වල සිද්ධිය සම්බන්ධයෙන් මැදිහත් වුණා. අන්තිමට එහිදී ඇති වූ ප්‍රතිඵලය අපි දකිනවා. අද දවසේ ඇන්සල් ආයතනයේ වර්ජනය. දැනට දවස් 28 ක් වෙනවා. සේවකයන් දහස් ගණනක් එළියේ ඉන්නවා. තමුන්නාන්සේලා දන්නවා ඇන්සල් ආයතනය මීට පෙර 1994 දීත් මේ වාගේ වර්ජනයක් තියලා පොලිස් ප්‍රහාරයට ලක් වෙලා, වෙඩි තියලා සේවකයෙක්ව මැරුවා. ඒ වාගේම අද දවසේත් මේක ඇති වෙලා තිබෙනවා. පළමුවෙන්ම කම්කරු සමිතියේ සභාපති අතුල කමල් මහතාට පාලන අංශය විසින් මැර ප්‍රහාරයක් එල්ල කරලා. කිරිබත්ගොඩ ප්‍රදේශයේදී. ප්‍රදීප් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත් දන්නවා. එතුමාව ඉවත් කළා. රැකියාවෙන්ම ඉවත් කළා. යූනියන් එකේ සභාපතිතුමාව. ඊට අමතරව ඒකට සහයෝගය දුන්නා කියලා 10 දෙනෙක් ඉවත් කළා. දැන් 11 දෙනයි. දැනට දවස් 28 යි.

ගරු සභාපතිතුමනි, අද ඒ ඉන්න මානව සම්පත් කළමනාකාරතුමිය ඇතුළු පාලක මණ්ඩලය ඉතාම දැඩි තීන්දු ගන්නවා. දැන් ඉන්නවා 800 කට ආසන්න ප්‍රමාණයක්. මේ අයවත් ඉවත් කරන්න යන්නේ. මෙවැනි තත්ත්වයක් තුළ කම්කරු අමාත්‍යතුමා ඊයේ සාකච්ඡාවක් කළා. ඒත් කම්කරු කොමසාරිස් ජෙනරාල්තුමිය - BOI ආයතනය මොනවා කිව්වත්, රජය මොනවා කිව්වත් මේ ඇන්සල් ආයතනයේ පාලක පක්ෂය පිළිගන්නේ නැහැ. අනෝමා ද සිල්වා මැතිනිය කියලා තිබෙනවා, ජනාධිපතිතුමා කිව්වත් මම කරන්නේ නැහැයි කියලා. එතුමිය ඉල්ලීමක් කරන්නේ, මේ 11 දෙනා ඉවත් කරන්නේ නැතිව චෝදනා දීලා රැකියාව කරන අතරතුරදී පරීක්ෂණයක් කරන්න කියලා. ඒ විධියට වැඩ ටික කරන්න කියලා. කෙළින්ම ඉවත් කරමින් ඒ ගමන යාම තුළ විශාල අසාධාරණයක් සිද්ධ වන්නේ. අපි දන්නවා ඇන්සල් ලංකා ආයතනය කියන්නේ ගරු සභාපතිතුමනි, රතුපස්වල තිබුණු ආයතනය හා සමාන එකක් කියලා. ඒකෙත් හදන්නෙත් ග්ලව්ස්. අද සේවකයන් එළියට බැහැලා. ඒකෙත් රසායනික ද්‍රව්‍ය තිබෙනවා කියන තත්ත්වය හෙළි වෙනවා. ඉතින් රැකියාව නැති වෙනවා. ආයතන වැහෙනවා. මේ සම්බන්ධයෙන් මම ඉල්ලීමක් කරනවා. අපේ බස්නාහිර පළාතේ ප්‍රධාන ආයෝජන කලාපයක් තමයි, බියගම අයෝජන කලාපය. එහි තිබෙන ප්‍රධාන ආයතනයක් තමයි මේ ඇන්සල් ලංකා ආයතනය. ඉතින් ඇන්සල් ලංකා ආයතනයේ සේවක සේවිකාවන්ගේ රැකියාවන් නැතිවන තත්ත්වයකට පත්වෙලා තිබෙන අවස්ථාවක මම ඉල්ලීමක් කරනවා, මේ සම්බන්ධව කඩිනම් පිළිතුරක් නැත්නම් කඩිනම් විසඳුමක් අපේ බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මැදිහත් වීම ඇතිව, ගරු කම්කරු අමාත්‍යතුමාගේත්, කම්කරු කොමසාරිස් ජෙනරාල්තුමිය නැත්නම් ආයෝජන ප්‍රවර්ධන කලාපයේ කළමනාකාරතුමා මේ සම්බන්ධයෙන් මැදිහත් කරගෙන මේ පිළිබඳව විසඳුමක් ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. අදට දවස් 28 යි. ඇන්සල් ලංකා ආයතනය කියලා කව්රුත් දන්නවා.

බස්නාහිර පළාත් සභාවේ ජනතාවගේ මන්ත්‍රීවරු වශයෙන්, ගම්පහ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු වශයෙන් යාබද බියගම ආසනයේ මෙවැනි දෙයක් සිදුවෙනවා නම් කව්රුත් දුක් වෙන්න ඕනෑ. මම ඒ අවස්ථාවට සහභාගි වුණා. කවුරු හරි කියනවා නම්, විපක්ෂයෙන් මේක අවුස්සන්න හදනවා කියලා. එහෙම නොවෙයි. මම වර්ජනය කරන තැනට ගියා. ජනතාවගේ දුක ඇසුවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, නැත්නම් මේක අවුස්සන්න ගිහිල්ලා, කළබල කරන්න ගිහිල්ලා රතුපස්වල සිද්ධිය කරන්න නොවෙයි බලාපොරොත්තුව. බස්නාහිර පළාත් සභාවේ ඡන්දයක් තිබෙන වෙලාවක තවත් මේක උඩු දුවන්න දෙන්නේ නැතිව කටයුතු කරන්න. මේ පිළිබඳව විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් මගේ යුතුකම කරන්න ඕනෑ ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. මෙතැනදී ආණ්ඩුව කියන දේවල් පිළිගන්නේ නැති තත්ත්වයකට Management එක ඉන්නවා නම්, එහි වරදක් තිබෙනවා. මේ වැරැද්ද හදන්න කියන ඉල්ලීම කරන එක තමයි මගේ බලාපොරොත්තුව වන්නේ. ස්තුතියි.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ස්තුතියි ගරු සභාපතිතුමනි. විශේෂයෙන්ම අපි පෞද්ගලිකව දන්නවා අධ්‍යාපන ඇමතිවරයා මේ මෑතකදී ප්‍රකාශයක් කළා විශේෂයෙන් ජාත්‍යන්තර පාසල්වල ආගම, මව් භාෂාව, ඉතිහාසය උගන්වන්න කැබිනට් පත්‍රිකාවක් එතුමා ඉදිරිපත් කර තිබෙනවා කියලා. ගරු සභාපතිතුමනි, මේ ජාත්‍යන්තර පාසල් කියලා කියන්නේ - මේ රටේ ජාත්‍යන්තර පාසල් නිර්මාණය වුණේ විශේෂයෙන්ම මේ රටේ ඉන්න තානාපතිවරුන්ගේ ළමයින්ට ඉගෙන ගන්න. විදේශිකයන්ගේ ළමයින්ට ඉගෙන ගන්න. ඒකට තමයි මේ ජාත්‍යන්තර පාසල් ඇති වුණේ. නමුත් අද වනකොට මේ රටේ ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයට සරිලන විධියට ජාත්‍යන්තර පාසල් ගණනාවක් හැම නගරයක් පුරාම අද ඇති වෙලා තිබෙනවා. අද බස්නාහිර පළාතේ ව්‍යාපාර නාම ලියාපදිංචි රෙජිස්ටාර් යටතේ පාසල් 250 ක් අද ලියාපදිංචි වෙලා තිබෙනවා. නමුත් මේ රටේ නීතිය අනුව 1961 පෞද්ගලික පාසල් රජයට පවරා ගැනීමේ නීතිය උඩ ඒ පෞද්ගලික පාසල් මේ රටේ පවත්වන්න බැහැ. නීතියෙන් කිසිම ඉඩක් නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

ගරු මන්ත්‍රීතුමා ව්‍යාපාර නාම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වෙලා තිබෙන්නේ, පෞද්ගලික පාසල් හෝ ජාත්‍යන්තර පාසල් කියලා නොවෙයි. වෙනත් විධියකට තමයි ලියාපදිංචි කරලා තිබෙන්නේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඒක තමයි මම පැහැදිලි කරන්නේ. මම පැහැදිලි කරන්නේ ව්‍යාපාර නාම ලියාපදිංචිය අපේ බස්නාහිර පළාත යටතේ තිබෙන ජාත්‍යන්තර පාසල්, මේ අය ව්‍යාපාර අධ්‍යාපන ආයතන එහෙම නැත්නම් උපකාරක පංති කියලා ලියාපදංචි කරලා තිබෙනවා. නමුත් පළාත් සභාව යටතේ ලියාපදිංචි වෙලා තිබෙන ඒ ආයතන ව්‍යාපාර හැටියට ඒගොල්ලෝ කරන්නේ ඉස්කෝල පවත්වාගෙන යැමයි. මේ වාගේ ජාත්‍යන්තර පාසල් නමින් ඉස්කෝල 250 ක් බස්නාහිර පළාත් සභාව යටතේ තිබෙනවා. ළමයි 5000 කට වැඩිය ඉගෙන ගන්නවා. රටේ නීතියෙන් ඒකට කිසිම ඉඩක් නැහැ.

ගරු සභාපතිතුමනි, ඉඩක් නැති වුණාට හැම නගරයකම එවැනි පාසල් පටන් ගන්නවා. අද මේ ජාත්‍යන්තර පාසල් හරහා විශාල විනාශයක්, අපරාධයක් කුඩා දරුවන්ගේ ප්‍රාථමික අධ්‍යාපනයට සිදු වෙනවා. මේවාට විධිමත් ගුරුවරු නැහැ. සුදුසුකම් ඇති ගුරුවරු නැහැ. තැනක් කුළියට අරගෙන බෝඩ් එකක් දාලා ඉස්කෝලයක් පටන් ගන්න කාටත් පුළුවන්. මේක හරියට - අපේ කැසිනෝ සම්බන්ධ ඇමතිතුමා කිව්වා, කැසිනෝ එකට ලයිසන් දෙන්නේ නැහැයි කියලා. නමුත් කැසිනෝ එනවා. අන්න ඒ වගේ ඉස්කෝල පටන් ගන්න බැහැ. මේ රටේ නීතිය අනුව. නමුත් එවැනි පාසල් තිබෙනවා. ද්විතියික හා ප්‍රාථමික පාසල් පවත්වාගෙන යනවා. පෞද්ගලික පාසල් හැටියට පවත්වාගෙන යනවා. විශේෂයෙන්ම බන්දුල ගුණවර්ධන ඇමතිතුමා මේ කියන මව් භාෂාව, ආගම, ඉතිහාසය උගන්වන්න කියලා කියන්නේ, මොන ජාත්‍යන්තර පාසල්වලටද? විදේශීය ළමයි ඉගෙන ගන්න ජාත්‍යන්තර පාසල්වලටද? එහෙම නැත්නම් ගරු ප්‍රධාන අමාත්‍යතුමා කියන විධියට හොරට පටන් ගන්න ජාත්‍යන්තර පාසල්වලටද, මව් භාෂාව, ඉතිහාසය උගන්වන්න කියන්නේ. ඒ අය ලියාපදිංචි වෙලා තිබෙන්නේ, ඉස්කෝල හැටියට නොවෙයි. අවසර දෙන්න බැහැ. නමුත් ඉස්කෝල තිබෙනවා. 250 කට වැඩිය ඉස්කෝල තිබෙනවා. එහෙම නම් බන්දුල ගුණවර්ධන ඇමතිතුමා පැහැදිලිව කියන්න ඕනෑ, මේ ඉස්කෝල ටිකටද, ඒ කියන්නේ හොරුන්ටද කියන්නේ ආගම උගන්වන්න කියලා. හොරුන්ටද කියන්නේ ඉතිහාසය උගන්වන්න කියලා. හොරුන්ටද කියන්නේ ආගම උගන්වන්න කියලා. හොරුන්ටද කියන්නේ මව් භාෂාව උගන්වන්න කියලා.

විශේෂයෙන්ම ආණ්ඩුවේ අධ්‍යාපනය පෞද්ගලීකරණයේ ප්‍රතිපත්තිය ප්‍රධාන අංගයක් බවට පත්වෙලා තිබෙනවා. මොකද, අද වන කොට පළමුවෙනි ශ්‍රේණියට ළමයින් ඇතුළත් කර ගන්න විධිමත් වැඩ පිළිවෙළක් නැහැ. අද ජනප්‍රිය පාසල්වලට ඒ තරගකාරීත්වය උඩ දෙමව්පියන්ට ජනප්‍රිය පාසල්වලට තමන්ගේ ළමයින් දාගන්න බැරි වුණම ඔය කියන හොර පාසල්වලට තමන්ගේ ළමයින්ව දාලා ඒ ළමයින්ගේ අනාගතය විනාශ කරලා තිබෙනවා. ඒ නිසා

[ ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන් ]

අවසාන වශයෙන් මම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තමයි මේවා ලියාපදිංචි වෙන්නේ. ඒ නිසා ඔබතුමා මේ සභාවට පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ඔබතුමා කොහොමද මේ ඉස්කෝල පවත්වාගෙන යන්නේ කියලා.

ඊළඟට සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර මැතිතුමාගේ පිළිරුවට මල් මාලා දැම්මාට, මල් පූජා කළාට නිදහස් අධ්‍යාපනය ආරක්‍ෂා වෙන්නේ නැහැ. ඒ කන්නන්ගර මැතිතුමාගේ ඒ අධ්‍යාපන ප්‍රතිපත්ති අනුගමනය කළේ නැත්නම් මේ රටේ ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයත් පෞද්ගලික කරණය කිරීම පටන් අරගෙන තිබෙනවා කියලා මම මේ සභාවට කියන්න ඕනෑ. ස්තුතියි.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, මේ නොවැම්බර් මාසයේදී ලංකාවේ පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලයීය නායක සමුළුව සඳහා එහි ප්‍රධාන ආරාධිතයා ලෙස වාල්ස් කුමාරයා සම්බන්ධ වෙනවාය කියලා මුළු රටම දන්නවා. ඒ වාල්ස් කුමාරයා සම්බන්ධයෙන් කරුණු සොයා ගෙන යන කොට ගරු සභාපතිතුමනි, එතුමා පසුගිය දෙසැම්බර් මාසයේ ලන්ඩනයේ එක්තරා පාසලකට ගියා. ඒ පාසලට ගියාට පස්සේ ඒ පාසලේ හිටපු එක ශිෂ්‍යයෙක් ඇහුවා, ඔබ බ්‍රිතාන්‍ය රාජාවලියේ වඩාත් කැමැති රජ්ජුරුවෝ කවුද කියලා. එම ප්‍රවෘත්තිය පුවත්පත් ගණනාවක වාර්තා කරලා තිබුණා.

*Prince Charles tells school children that King George III is the monarch he most respects.*

මේ වාල්ස් කුමාරයා වැඩිපුරම කැමැති රජ්ජුරුවෝ තමයි බ්‍රිතාන්‍ය රාජාවලියේ III වැනි ජෝර්ජ් රජ්ජුරුවෝ. ගරු සභාපතිතුමනි, III වැනි ජෝර්ජ් රජ්ජුරුවෝ කියලා කියන්නේ 1760 ඉඳලා 1820 දක්වා බ්‍රිතාන්‍යයේ රජ කරපු පාලකයා. 1820 දක්වා. 1815 තමයි අපේ රට සම්පූර්ණයෙන් සුද්දා යටත් කර ගත්තේ. අවුරුදු දෙකාමාරකට පස්සේ ඌව වෙල්ලස්සෙන් අපේ රටේ පළමුවැනි ජාතික විමුක්ති අරගලය පැන නැඟුනා. නොවැම්බර්. අවුරුදු දෙකාමාරකට පස්සේ. එය යටත් කර ගන්න අණ දුන්නේ, III වැනි ජෝර්ජ් රජ්ජුරුවෝ. ජෝර්ජ් රජ්ජුරුවන්ගේ තුන්වැනි මී මුණුපුරාව තමයි, අපි පොදු රාජ්‍ය මණ්ඩලයීය නායක සමුළුව තියලා, එහි ප්‍රධාන ආරාධිතයා හැටියට කැඳවාගෙන සමරන්න හදන්නේ.

ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි. අපේ රටේ ඒ පළමු ජාතික නිදහස් අරගලයේදී, ඌව - වෙල්ලස්ස අරගලයේදී ඒකට නායකත්වය දීපු අපේ හාමුදුරුවෝ, ඒකට නායකත්වය දීපු අපේ නායකයෝ වැඩි හරියක් ඝාතනය කළේ, මේ වාගේ නොවැම්බර් මාසයක. නොවැම්බර් මාසයේ 14 වැනිදා දඹගොල්ලේ හාමුදුරුවෝ - අස්ගිරි විහාරයේ හිටපු මහා නායක හාමුදුරු කෙනෙක්. මේ මහා ජාතික අරගලයට නායකත්වය දුන්නා. උන්වහන්සේට මරණ දඬුවම දුන්නේ නොවැම්බර් 14 වැනිදා. ඒ වාගේම තමයි, සිවුරේ ඉඳගෙන, ශාසනයේ ඉඳගෙන මේ ජාතික අරගලයට නායකත්වය දුන්න ඉහගම රතනපාල හාමුදුරුවෝ. උන් වහන්සේට මරණ දඬුවම දුන්නේ, නොවැම්බර් 17 වැනිදා. මෙම අරගලයේ නායකයෙක් වුණු බූටාවේ රටේ රාළට මරණ දඬුවම දුන්නේ නොවැම්බර් 18 වැනිදා. ඒ විතරක් නොවෙයි. මේ පළමුවැනි ජාතික විමුක්ති අරගලයේ සංකේතය වූ, අපි හැමදෙනාම පක්ෂ භේදයක් නැතිව ගරු කරන වීර මොණරවිල කැප්පෙටිපොළගේ හිස ගසා දැම්මේ නොවැම්බර් 26 වැනිදා. එතුමා අපේ රටේ ජාතික වීරයෙක් වුණු, අපි හැමදෙනාම ගරු කරන ජාතික විමුක්ති අරගලයේ පතාක යෝධයා. එතුමා ඇතුළු මේ නායකයන්ට මරණ දඬුවම දෙන්න අණ දීපු රජ්ජුරුවෝ තමයි III වැනි ජෝර්ජ් රජ්ජුරුවෝ. අනික් පැත්තෙන් නොවැම්බර් මාසයේ. මේ සියල්ල තියෙද්දී මේ දේශප්‍රේමී ආණ්ඩුව. දේශප්‍රේමී කියා ගන්නා, හැම තිස්සේම දේශප්‍රේමය ජප කරන, දේශප්‍රේමය තමන්ගේ දිව මතුර බවට පත් කරගෙන තිබෙන, දේශප්‍රේමයම තුන් වේලටම අනුභව කරන ආණ්ඩුව (බාධා කිරීමක්) වාල්ස් කුමාරයා ගෙනැල්ලා මොකක්ද කරන්න හැදුවේ. එස්.බී. දිසානායක ගරු ඇමැතිතුමා පාර්ලිමේන්තුවේ කියනවා. ඔක්තෝබර් මාසයේ 09 වැනිදා. වාල්ස් කුමාරයා ආවට පස්සේ එයාට කියලා මීරිගම ආයෝජන කලාපයේ පෞද්ගලික විශ්ව විද්‍යාලයක් සඳහා මුල්ගල තියනවා කියලා. (බාධා කිරීම්)අපේ රටේ අධ්‍යාපනය විනාශ කරන්න මුල් ගල් තියන්නේ වාල්ස් කුමාරයාට කියලා. දැන් අපි ඒකට විරෝධය ප්‍රකාශ කරන්න -

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

මුළු ලෝකයම සලකන අපේ රජිනි පවුල

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අහගෙන ඉන්න කෝ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

කිව්වට අහන්නේ නැහැ. කළබල වෙන්න එපා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අර පහේ හපන්නු වැඩේ කරන්න ගිහින් මහරගමදී වුණු වැඩේ මතක නේ. අර සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාගෙන් අහන්න කෝ පහේ හපන්නුන්ට මොකද වුණේ කියලා. (බාධා කිරීමක්) ගරු සභාපතිතුමනි, එහෙම ආණ්ඩුවක් තමයි අපේ රට යටත් කර ගත්ත අය ගෙනැල්ලා ඒක සමරන්න යන්නේ. ඒ නිසා අපි මේ -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

විජේවීර සහෝදරයා ඝාතනය වුණේ, නොවැම්බර් 13 දා. ඒක නැද්ද?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඔබතුමන්ලාට කරන්න හොඳයි. මේක අහගෙන ඉන්න බැහැ. මහා දේශප්‍රේමී ආණ්ඩුවලු. කැප්පෙටිපොළත් සමරනවාලු. අයියෝ, ගරු සභාපතිතුමනි, අපේ රටේ දේශප්‍රේමීන් අතින් ඝාතනය වුණු දේශද්‍රෝහී බ්‍රිතාන්‍ය සෙබළුන්ගේ සුසාන භූමිය බලන්නත් වාල්ස් කුමාරයා යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මේක තමයි ඉතිහාසයේ සරදම. අද ආණ්ඩුව තමන්ගේ දේශප්‍රේමී සළුවෙන් වහගන්න හැදුවාට ඒ දේශ ද්‍රෝහීකම එළි වෙලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මේ සමුළුවට අපේ සම්පූර්ණ විරෝධය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

ගරු සභාපතිතුමනි, අවස්ථාවාදී, ඒ වාගේම ජාතිවාදී ඇතැම් දේශපාලඥයින් විසින් මේ රට තුළ ජාතිවාදය වැපිරීමේ ප්‍රතිඵලයක් හැටියට අවුරුදු 30 ක් තිස්සේ අප විසින් මුහුණ දුන්නු අවාසනාවන්ත අත්දැකීම් පිළිබඳව අපි කවුරුත් දන්නවා. ඒ අවාසනාවන්ත අත්දැකීම් ඉතිහාසයට එකතු වෙලා ජාතියක් හැටියට පෙරට යන මොහොතේ, නැවතත් ඒ යට වුණු ජාතිවාදී ආකල්ප අවුලුවා ලීම පිණිස ඇතැම් ජාතිවාදී බලවේග විසින් කරනු ලබන්නා වූ ප්‍රකාශ ,මෙරටට ආදරය කරන සෑම පුරවැසියෙක් විසින්ම හෙළා දකින්නට ඕනෑ. අපි දැක්කා පසුගිය දවස්වල ජාතික පුවත්පත් ගණනාවකම උතුරේ ගරු ප්‍රධාන අමාත්‍ය විග්නේෂ්වරන් මහතා විසින් කරන ලද ඉතාම සැහැසික ජාතිවාදී ප්‍රකාශයක්. එතුමා කියනවා, උතුරේ සිංහල ජනතාව නැවත පදිංචි කිරීමට ඉඩ දෙන්නේ නැහැයි කියලා. මේ ප්‍රකාශය ඉතාම ජාතිවාදී, සැහැසික ප්‍රකාශයක්. මේ ප්‍රකාශය තුළින් ව්‍යංගර්ථයෙන් කියැවෙන දේ තමයි දෙමළ ජනතාවට උතුරේ හැර වෙනත් කිසිදු ප්‍රදේශයක පදිංචි වෙන්න අයිතියක් නැහැයි කියන කාරණය. උතුරේ සිංහල ජනතාව නැවත පදිංචි කරවන්නට ඉඩ දෙන්නේ නැහැයි කියන ප්‍රකාශයේ බරපතළකම තිබෙන්නේ, මේ ප්‍රකාශය තුළින් දකුණේ අන්තවාදී සිංහල ජන කොටස් කැළඹීමට පත් වීමයි.

අපි කවදත් විශ්වාස කරනවා, සිංහලයා ජාතිවාදියෙක් නොවෙයි. නමුත් සිංහල ජනතාව අතරත් අවස්ථාවාදී, ඒ වාගේම අන්තවාදී ජන කොටස් ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා මේ ප්‍රකාශය හරහා නැවතත් මේ රටේ ජාතිවාදය ඇවිස්සීමක් සිදු වෙන්න පුළුවන්. ඒ නිසා මේ රටට ආදරය කරන සෑම දෑ හිතකාමී පුරවැසියෙකුටම වගකීමක් තිබෙනවා, මේ අන්තවාදී, ජාතිවාදී සැහැසික ප්‍රකාශය හෙළා දකින්නට. ඒ නිසා මේ පසුපස අපි දකින්නේ, යුද්ධයෙන් පස්සේ ජාතීන් අතර ඇති වෙලා තිබෙන සංහිඳියාව,

[ ගරු සුගත් මතුගමගේ ]

ඒ ජාතීන් අතර ඇතිවෙලා තිබෙන සහෝදරත්වය බිඳ දමන්නට කරනු ලබන්නා වූ සැහැසික කුමන්ත්‍රණයක් හැටියටයි. මේ ප්‍රකාශයන් හමුවේ එක පැත්තකින් ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය ඇතුළු බටහිර තානාපති කාර්යාල මුනිවත රකිනවා. යම් හෙයකින් දකුණේ සිංහල නායකයෙකු විසින් මේ ප්‍රකාශය කරනු ලැබුවා නම්, මේ සම්බන්ධයෙන් ඔවුන් දක්වන්නා වූ ප්‍රතිචාරය කෙබඳුද කියන එක අපි අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. එහෙත් විග්නේෂ්වරන් විසින් කරන ලද මේ ජාතිවාදී සැහැසික ප්‍රකාශය හමුවේ මුනිවත රකින තත්ත්වයට අද ඔවුන් පත් වෙලා තිබෙනවා. ඒ නිසා විග්නේෂ්වරන් මෙහෙයවන හස්තය කුමක්ද කියන එක පිළිබඳව බොහොම පැහැදිලියි. ඒ නිසා මේ දෑ හිතකාමී ජනතාවගෙන්, මේ රටට ආදරය කරන සියලු දේශප්‍රේමී ජනතාවගෙන් අපි ආදරයෙන් ඉල්ලා සිටිනවා. මේ විග්නේෂ්වරන් මහතාගේ ප්‍රකාශය හෙළා දකින්න. ඒ විතරක් නොවෙයි. ජාතිවාදී බලවේග නැවත මේ රට තුළ මතු වන එකට එරෙහිව ක්‍රියාත්මක වෙන්නය කියන ආයාචනය අපි මේ මොහොතේ කරනු ලබනවා. බොහොම ස්තුතියි.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතියි. පදික වෙළඳාම් කිරීම සම්බන්ධවයි මම කථා කරන්නේ. ලෝක ඉතිහාසයේ පැරණිම වෙළඳාම තමයි පදික වෙළඳාම. මුළු ලෝකයේම සියලුම රටවල්වල පාහේ තිබෙන වෙළඳාමක් තමයි මේ පදික වෙළඳාම කියලා කියන්නේ. අද මේ පදික වෙළඳාම කරන්නේ අසරණම දුප්පත් ජනතාව. මේ පදික වෙළඳුන්ට අද පොලීසිය මඟින් සැහෙන්න අකටයුතුකම් කරනවා. අසාධාරණකම් කරනවා. ඔවුන්ව අත්අඩංගුවට අරගෙන උසාවි දානවා. කිසිම හේතුවක් නැතිව. පදික වෙළඳාමේ අතේ තියාගෙන වෙළඳාම් කරන කට්ටිය පවා පොලීසියෙන් අත්අඩංගුවට ගන්නවා. මේක ඉතාම අසාධාරණ කාරණාවක්.

මට මතකයි, 2001 වාගේ එක්සත් ජාතික පක්ෂය රජය කාලයේ එක්සත් ජාතික පක්ෂය විසින් කොළඹ පදික වෙළඳුන්ව ඉවත් කිරීම සඳහා ක්‍රියාමාර්ගයක් ගනු ලබන අවස්ථාවේදී, වර්තමාන ජනාධිපති එවකට හිටියේ විපක්ෂ නායකයා වශයෙන්. ඒ විපක්ෂ නායකතුමා ඒ පදික වෙළඳුන්ව එකතු කරගෙන එයට විරුද්ධව නැඟී සිටීමට කටයුතු කළා. ඔවුන්ට ලියුම් දීලා නැඟී සිටීමට පවා ඉදිරිපත් වුණා. නමුත් අද හාත්පසින්ම වෙනස් වාතාවරණයකට පත් වෙලා තිබෙන්නේ. මේ පදික වෙළඳාම අතුරු පාරවල්වල පවා - ප්‍රධාන පාරවල් ගැන මම කථා කරනවා නොවෙයි. අතුරු පාරවල්වල පවා මේ පදික වෙළඳාම් කිරීමට පොලීසිය ඉඩ දෙන්නේ නැහැ. මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මෙයට මැදිහත් වෙලා - දැන් වර්තමානයේදී ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් කරත්ත ලබා දුන්නා. මේ කරත්ත ලබා දීමේදී පවා සෑම පොලීසියකටම, සෑම තැනකටම ලියුම් දීලා තමයි ලබා දීලා තිබෙන්නේ. නමුත් ඒ කරත්තයේ තියාගෙන හරි පදික වෙළඳාමේ යෙදීමට පොලීසියෙන් ඉඩ දෙන්නේ නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ජනාධිපතිතුමාගේ ෆොටෝ එක ගැහුවේ නැද්ද?

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ජනාධිපතිතුමාගේ නොවෙයි, කාගේ ෆොටෝ ගැහුවත් පොලීසියෙන් ඉඩ දෙන්නේ නැහැ. එවන් තත්ත්වයක් උදාවෙලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටිනවා. මෙයට මැදිහත් වෙලා මේ පදික වෙළඳුන්ව රැක ගන්න කටයුතු කරන්න කියලා. අද සෑහෙන්න අමාරුකම් ඇතිව දුෂ්කරතා මැදින් තමයි ජනතාව ජීවත් වෙන්නේ. ඉතින් මේ පදික වෙළඳුන් සැහෙන්න අමාරු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ගිය සතියේ කොම්පඤ්ඤ වීදියේ අතුරු පාරවල්වල ඒ වාගේ කරත්තය තල්ලු කරගෙන යන අයව පවා පොලීසිය අරන් ගිහිල්ලා තියෙනවා. ඔවුන්ව උසාවි දැම්මා නම්, දඩය රුපියල් 5000/- යි.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඒ චෝගම් හින්දා.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

චෝගම් නිසා පමණක් නොවෙයි. පොලිසිය හිතුමතේට කටයුතු කරපු නිසා. පරිසර පොලිසියක් කියලා පටන් අරගෙන තිබෙනවා. ඒ පරිසර පොලීසියේ ස්ථානාධිපතිගේ ගෙදර රණ්ඩුවක් වුණා නම්, පවුලත් එක්ක රණ්ඩුවක් වුණා නම් පාරේ ඉන්න පදිකයන් ඉවරයි. එවන් තත්ත්වයක් උදා වෙලා තිබෙන්නේ.

ඉතින් ගරු සභාපතිතුමනි, තව දෙයක් තිබෙනවා. මේ පදිකයන් සඳහා ඩිමෝ බට්ටා ලබා දීලා තිබෙනවා. මේ ඩිමෝ බට්ටා පවා පොලීසියෙන් තියා ගන්න දෙන්නේ නැහැ. (බාධා කිරීමක්) ඒ වාගේ තත්ත්වයක් උදාවෙලා තිබෙන්නේ. ගෙවීමේ ක්‍රමයට තමයි ඒවා අරන් දීලා තිබෙන්නේ. ඉතින් මම ඉල්ලා සිටිනවා. බස්නාහිර පළාත් සභාව හැටියට අපි මෙයට මැදිහත් වෙන්න ඕනෑ. අනිවාර්යයෙන්. මේ ජනතාව සැහෙන්න අමාරුකම් මත ජීවත් වෙනවා. අපේ

ගරු සභාපතිතුමා හරහා මම ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. පොලිසියත් එක්ක කථා කරලා හරි -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු මහ ඇමැතිතුමාට පොලිස් බලතල තිබෙනවා.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

මේ පදිකයන් ගැන සැලකිලිමත් වෙලා, මේ පදිකයන්ට නිසියාකාරව වෙළඳාම් කිරීමට අවශ්‍ය වාතාවරණය සලසා දෙන ලෙසත්, ඔවුන්ව ඒ මඟට යොමු කරලා, ඔවුන්ගේ රැකියාවල් කර ගැනීම සඳහා උදව් කරන ලෙස ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

# පළාත් සභාවේ රැස්වීම - I
PROVINCIAL COUNCIL MEETING - I

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා)
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs.)

ගරු සභාපතිතුමනි, *" 203.10.22 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළඹුණු එකඟතාවයට අනුව අද දින විසිර යෑමෙන් අනතුරුව මෙම සභාව 2013 නොවැම්බර් මස 26 වන දින පෙ.ව. 09.30 ට රැස් විය යුතු අතර, 2013 නොවැම්බර් මස 19 වන දිනය (අඟහරුවාදා) සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස සැලකිය යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ රැස්වීම - II
PROVINCIAL COUNCIL MEETING - II

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, *" 2014 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් සම්බන්ධයෙන් මින් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණද, ඒ කිසිත් නොතකා 2013.10.22 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළඹුණු එකඟතාවය ද සැලකිල්ලට ගෙන, 2013 දෙසැම්බර් මස 03, 04, 05, හා 06 දිනයන්, 2014 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු - I
PROVINCIAL COUNCIL AFFAIRS - I

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, *" මින් පෙර කිනම් තීරණයක් එළඹුණද ඒ කිසිත් නොතකා 2014 වර්ෂයේ මුදල් ප්‍රකාශය පළාත් සභාවට ඉදිරිපත් කිරීම 2013.11.26 දින සිදු කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු - II
PROVINCIAL COUNCIL AFFAIRS - II

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, *" අද දින න්‍යාය පත්‍රයේ අංක XI පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු යටතේ වූ වැඩ කටයුතුවල කාර්යය අනුපිළිවෙළ පිළිවෙළින් විෂයය අංක 03, 01 හා 02 වන පරිදි විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව අද දින න්‍යාය පත්‍රයේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවන්හි අනුපිළිවෙළ වෙනස් වෙනවා. පසුගිය සභා රැස්වීමේදී වැඩ කටයුතු අවසන් නොවූ නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට වැඩ කටයුතු ප්‍රමුඛතාවය ගැනෙනවා.

ඒ අනුව නෙලුක් දර්ශන මල්ලව ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව 2013.10.22 වන දින සභා රැස්වීමේ වැඩ කටයුතු. එම යෝජනාව පිළිබඳ විවාදය අවසන් වීමක් සිදු වුණේ නැහැ. ඒ අනුව එම යෝජනාව මම යළිත් සභාවට ඉදිරිපත් කරනවා.

*ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.* ***[2013.10.22]***
*Question proposed[**2013.10.22**]*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : PRIVATE MEMBERS' MOTION:

*"රාජ්‍ය සේවයට කාර්ය මණ්ඩල බඳවා ගැනීමේදී එම කාර්ය මණ්ඩලය තුළ සිටින පහළම තනතුර දරන්නා වන්නේ කම්කරුවායි. එම කම්කරුවා මීට පෙර තනතුරු සඳහා ඇතුළත්වීමේදී අවම අධ්‍යාපන මට්ටමක් පැවතියද, එය රාජ්‍ය සේවයට ඇතුළත් වීමට ප්‍රමාණවත් විය. නමුත් මේ වනවිට රජය තීරණය කර ඇති පරිදි කම්කරු තනතුරු ලබා ගැනීමේදී අ.පො.ස. (සා.පෙළ) පරීක්ෂණයෙන් විෂයයන් 06 සමත් වී (ගණිතය ඇතුළුව) සම්මාන සාමාර්ථ 02 ක් තිබිය යුතුය. මෙය රටේ සාමාන්‍ය පෙළ අපේක්ෂකයින්ගෙන් 50% කට පමණ ඍජු ලෙසම බලපාන තීන්දුවකි. මන්ද යත්, සාමාන්‍ය පෙළ පරීක්ෂණයේදී ගණිතය විෂයය අසමත් වන කණ්ඩායම 50% කට ආසන්නය. එයින් ගම්‍ය වන එක් දෙයක් වන්නේ, රටේ ශිෂ්‍ය ගහණයෙන් 50% කට රාජ්‍ය සේවයේ අවම රැකියාව හෝ ලබා ගැනීමට අවස්ථාවක් නොමැතිවීමයි. මෙය තුළ නිර්මාණය වන සමාජ අර්බුදය අනාගතයේ මහත් ව්‍යසනයක් ඇති කරනු ඇත. එම නිසා බස්නාහිර පළාත් රාජ්‍ය සේවාව සඳහා කම්කරු ශ්‍රේණියට බඳවා ගැනීමේදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා පෙනී සිටීම පමණක් සුදුසුකමක් සේ සලකා කටයුතු කරන ලෙස මෙම ගරු සභාව විසින් යෝජනා කර සිටින්නේය."*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුගත් මතුගමගේ ගරු මන්ත්‍රීතුමාට, විනාඩි 07 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා 10.17]

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

ගරු සභාපතිතුමනි, නෙලුක් දර්ශන මල්ලව ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද යෝජනාවට අදහස් දැක්වීම සඳහා අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තෙන්ම එතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව ඉතාම කාලීන වැදගත්කමකින් යුක්ත වූ යෝජනාවක් හැටියටයි මම දකින්නේ. මේ රටේ රාජ්‍ය සේවය සඳහා බඳවා ගැනීම් සිදු කිරීමේදී අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව සලකා බැලීම අත්‍යවශ්‍ය කාරණාවක්. රාජ්‍ය සේවය වඩා කාර්යක්ෂම වෙන්න, එය ඉහළ ඵලදායීතාවයෙන් යුක්ත වන සේවයක් බවට පත් කරන්නට විශේෂයෙන්ම බඳවා ගැනීමේදී අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව සලකා බැලීම වැදගත් වෙනවා. නමුත් රාජ්‍ය සේවයට බාධා වන, රාජ්‍ය සේවය බිඳ වැටීම්වලට ලක් වන බාධාවන් ඇති කරනවා නම් අපි ඒක බැහැර කරන්න ඕනෑ. අපි දන්නවා, මේ රටේ ගුරු වෘත්තිය සඳහා හෝ එහෙමත් නැත්නම් රාජ්‍ය සේවයේ වෙනත් ඉහළ තනතුරු සඳහා හෝ බඳවා ගැනීම් කිරීමේදී අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් වීම, අ.පො.ස. උසස් පෙළ සමත් වීම හෝ උපාධි සමත්වීම ආදී සීමාවන් පැන වීම යෝග්‍ය වුණත්, රාජ්‍ය සේවයේ පහළ ශ්‍රේණීන් සඳහා, විශේෂයෙන් කම්කරු තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමේදී අ.පො.ස. සාමාන්‍ය පෙළ විෂයයන් 06 ක් සමත් වීමත්, ගණිතය සමත් වීම ඇතුළුව අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන ලබා තිබීමත් කියලා. මෙවැනි සීමාවක් පැනවීම කාලෝචිත නැහැයි කියන එකයි මගේ අදහස වෙන්නේ. මේ තුළින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දක්වා අධ්‍යාපනය ලැබූ එහෙත් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත් නොවූ අයට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. අපි දන්නවා මේ රටේ ප්‍රාථමික අධ්‍යාපනයට පිවිසෙන අයගෙන 50% කට වඩා වැඩි පිරිසක් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) අසමත් වෙනවා. ඒක බරපතළ තත්ත්වයක්. එතකොට මේ අය සඳහා රාජ්‍ය සේවයට ඇතුළත් වෙන්නට අවස්ථාවක් ලබා දෙන්නේ නැහැයි කියලා කියන්නේ, ඉතාමත් බරපතළ තත්ත්වයක්. ඒ නිසා මේ සීමාවන්

සම්බන්ධයෙන් වෙනසක් ඇති වෙන්නට ඕනෑ. රාජ්‍ය සේවයට ඇතුළත් වීමේදී අවම වශයෙන් සාමාන්‍ය පෙළ විභාගය සඳහාවත් පෙනී සිටීම වැදගත්. නමුත් කම්කරුවන් වශයෙන් බඳවා ගැනීමේදී පවා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත් වී තිබීම අවශ්‍යයයි කියන කාරණාව සුදුසුයි කියලා මම හිතන්නේ නැහැ. ගුරුවරයෙක් හැටියට අපි කවදත් අගය කරනවා සුදුසුකම් සහිත පුද්ගලයන් මේ රාජ්‍ය සේවයට බඳවා ගන්න ඕනෑය කියන කාරණාව. හැබැයි ඒකෙන් කිසිසේත්ම අදහස් වෙන්නේ නැහැ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දක්වා අධ්‍යාපනය ලැබූ තරුණයන්ට, තරුණියන්ට රාජ්‍ය සේවයට ඇතුළත් වීමට තිබෙන අවස්ථාව මග හරවන්න ඕනෑය කියන කාරණය. ඇත්තෙන්ම මේ සීමාවන් හරහා කෙරෙන්නේ, රාජ්‍ය සේවය තවදුරටත් කඩාකප්පල් වෙන එකයි. රාජ්‍ය සේවය අකාර්යක්ෂම කරන්නට මේ හරහා කිසියම් අනුබල දීමක් සිද්ධ වෙනවා.

මොකද, අපි දන්නවා පසුගිය කාලය තුළ දිගින් දිගටම පෞද්ගලීකරණය හරහා රාජ්‍ය අංශය විනාශ කරන්නට දැවැන්ත ක්‍රියා මාර්ග ගත්තා. අපි දන්නවා, පසුගිය රජය කාලයේ මේ රටේ ඉතාම වැදගත් ආර්ථික මර්මස්ථාන රාශියක් පෞද්ගලීකරණය කරන්නට සූදානම් වුණා. ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ඇතුළු ජාතියේ ඉතාමත් වැදගත් ආර්ථික මර්මස්ථාන රාශියක් පෞද්ගලීකරණයට ලක් කරන්න සූදානම් වන මොහොතේ තමයි මේ රටට ආදරය කරන ජනතාව එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පරාජයට පත් කරලා එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවක් බලයට ගෙන එනු ලැබුවේ. ඒ නිසා මෙන්න මේ රාජ්‍ය අංශය පවු කරලා, රාජ්‍ය අංශය විනාශ කිරීමේ ඒ ක්‍රියාවලිය නැවත නැවතත් මේ නිලධාරී මාෆියාව හරහා ක්‍රියාත්මක වෙනවා කියන එකයි මම දකින්නේ. ඒ නිසා එදා එක්සත් ජාතික පක්ෂයේ ඒ ඊනියා ප්‍රතිපත්තිය පෙරට ගෙන යන නිලධාරී යාන්ත්‍රණයක් අද මේ ආණ්ඩුව ඇතුළේත් ක්‍රියාත්මක වෙනවා කියන එක පැහැදිලියි. අපි විශේෂයෙන් රජයට මතක් කරනවා, මේ මාෆියාව හරියට හඳුනා ගන්න. මේ මාෆියාව නිසා ආණ්ඩුව ඇඩි අසීරුතාවයන්ට පත් වෙනවා. ඒ වාගේම අපකීර්තියට පත් වෙනවා. ඒ නිසා මෙන්න මේ මාෆියාව පරාජයට පත් මාෆියාව පරාජයට පත් කරන්න නම්, මේ නිලධාරී මාෆියාව විසින් ගනු ලබන මෙවැනි අත්තනෝමතික තීන්දු පරාජයට පත් කරන්න ඕනෑ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ රාජ්‍ය අංශයේ කම්කරු තනතුරු සඳහා බඳවා ගැනීමේදී ඇති කරන ලද මේ සීමාවන්, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විෂයයන් 6 ක් සමග සම්මාන 2 ක්, ගණිතය විෂයය සමත්ව. මෙන්න මේ කාරණා නිසා තරුණයන්ට රැකියා සඳහා එන්න තිබෙන අවස්ථාව බොහෝ දුරට අහිමි වන බැවින් තරුණයන්ගේ බලාපොරොත්තු බිඳ වැටිලා, ඔවුන් මානසික වශයෙන් බරපතළ කඩා වැටුණු තත්ත්වයකට පත් වන එක වළක්වා ගන්නට ඕනෑ. අන්න, ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියන එක ඔබතුමා මගින් රජය වෙත යොමු කරනු ලබනවා. බොහොම ස්තුතියි.

[පූ.භා 10.28]

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, ඇත්තෙන්ම මම මෙපමණ ඉක්මණින් කථාව ලැබෙයි කියලා හිතුවේ නැහැ. නමුත් ඇත්ත වශයෙන්ම මේ වාගේ අත්‍යවශ්‍ය යෝජනාවකදී මටත් කථා කරන්නට අවස්ථාවක් සලසා දීම පිළිබඳව මම හුඟක් ස්තුතිවන්ත වෙනවා. මේක අපට ප්‍රායෝගිකව බලපාන ප්‍රශ්නයක්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය පොඩ්ඩක් වාඩි වෙන්න. මෙතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කරනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔබතුමාට මතක ඇති මම ගිය සභාවේදී කිව්වා, මන්ත්‍රීවරුන් හැටියට පළාත් සභාවෙන් අපේ වාහනවලට දීලා තිබෙන බලපත්‍රය පිළිබඳව ගැටළුවක් තිබෙනවාය කියලා. දැන් ඊයේ ජනමාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කළා, සියලුම බලපත්‍ර අයින් කර ගන්න කියලා. ඔබතුමා එදා මේ සභාවේදී අපට පොරොන්දු වුණා, අපේ තත්ත්වය පිළිබඳව අහලා මේ සභාවේදී දැනුම්දීමක් කරන්නම් කියලා. මම ඔබතුමාගෙන් අහනවා, මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ කියලා. කොයි එකද විශ්වාස කරන්නේ? ඊයේ ජනමාධ්‍යයෙන් බොහොම පැහැදිලිවම කිව්වා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. මටත් ඒ පිළිබඳව දැන ගන්න ලැබුණා. සියලුම ඒවා අයින් කරන්න කියලා නිවේදනයක් නිකුත් කළාය කියලා. මම ඒක දැක්කේ නැහැ. මට ඇහුනෙත් නැහැ. ඒ සම්බන්ධව කථා බහට ලක් වුණා. VIP ලේබලය අයින් කරන්න කියලා පොලිස්පතිතුමා නිවේදනය කරලා -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

VIP ලේබලය විතරක් නොවෙයි, පළාත් සභාවෙන් දීලා තිබෙන ලාංඡනයත්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව මම සොයා බලන්නම්. මම තවම හරියට දන්නේ නැහැ. නිශ්චිත තොරතුරක් ලැබුණේ නැහැ.

ගරු මන්ත්‍රීතුමා, ලේකම්තුමා මට දැන් ඒ සම්බන්ධව පැහැදිලි කිරීමක් කළා. පොලිස්පතිතුමා චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවාලු වාහනයේ තිබෙන පුළුවන් ලියාපදිංචි සහතිකය පමණයි කියලා. තිබෙන අනෙක් සියලුම ලේබල් අයින් කරන්න කියලා කියලා තියෙනවා. මම හිතන්නේ, සියලු දෙනාටම පොදුවේ බලපාන චක්‍රලේඛයක් තමයි නිකුත් කරලා තිබෙන්නේ. ඊයේ තමයි පොලිස්පතිතුමා විසින් මාධ්‍යයට නිකුත් කරලා තිබෙන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය ඔබතුමියට අවස්ථාව.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව මට සලසා දීම පිළිබඳව. ඒ වාගේම අපේ සහෝදර ගරු පළාත් සභා මන්ත්‍රී නෙලුක් මල්ලව මැතිතුමාටත් මම ඉතාමත් ස්තුතිවන්ත වෙනවා, සමාජයේ දැවෙන, කාලෝචිත ප්‍රශ්නයක් මේ ආකාරයෙන් විසඳා ගන්න උත්සාහ කරමින් සභාවට මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව. අද අපි ලොකු ගැටළුවකට මුහුණ පාලා තිබෙනවා, සාමාන්‍ය පෙළ සමත් අයට කම්කරු තනතුරු දෙන්න තීරණය කිරීම පිළිබඳව. ඒ සම්බන්ධයෙන් අපි ලොකු අර්බුදයකට මුහුණ පාලා තිබෙනවා. මොකද, මම දන්නවා. සමහර වෙලාවට අපි මුරකරු, කම්කරු වගේ තනතුරු විභාග සමත් අයට දෙනකොට ඒගොල්ලෝ ඒක කරන එක ප්‍රතික්ෂේප කරනවා. ඒගොල්ලෝ කැමැති නැහැ, ඒ වගේ තනතුරු දරන්න. බොහෝ අවස්ථාවලදී ඒ වාගේ අය රැකියාවල් ඉල්ලීමේදී ඔවුන්ට ඒ වාගේ රැකියාවල් ගන්න කියලා අපි කිව්වාට සාමාන්‍ය පෙළ සමත් කියන තත්ත්වයේ ඉන්න නිසා ඒ වාගේ රැකියාවල් කරන්න ඒ අය කැමැති වෙන්නේ නැහැ. ඒ වාගේම තමයි ගණිතය එක්ක 6 යි 2 ක් සමත් කියන එක. 6 යි 2 ක් විතරක් සමත් මිනිස්සු මේ රටේ නැහැ නේ? බොහොම සුළු පිරිසක් ඒ වාගේ අංශයට ඉන්නේ. එතකොට ඊට වැඩිය සමත් වෙනවා නම් සමහර විට 6 යි 3 යි. 6 යි 5 යි. ඔය වගේ විධියට තමයි සමත් වෙන්නේ. ඒ අය ඉන්නේ ලොකු මානසික ශක්තියකින්. අපි සම්මාන පහක් ඇතුව, සම්මාන හයක් ඇතුව සමත් වෙලා ඉන්නේ කියලා. අපේ කාලයේ නේ සම්මානවලට මුල් තැන දුන්නේ. නැත්නම් distinction ඒ වාගේ දැන් A 7 ක් A 8 ක් ඇතුව පාස් වන අය තමයි විශාල වශයෙන් ඉන්නේ. ඒ අය කවදාවත් මුරකරු, කම්කරු රැකියාවකට එන්නේ නැහැ. එතකොට මේ වාගේ රැකියාවල් ලබා දීමේදීත් ගැටළුවක් වෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මේ සුදුසුකම් තිබෙන අයට මේ රැකියාවන් දුන්නාට ඒ අය ඒ රැකියාවේ රැඳෙන්නේ නැහැ. නිතර නිතර මේවා මාරු කරන්නට සිද්ධ වෙනවා. අනෙක් එක මම හිතන්නේ, මේක මනුස්සයෙකුගේ මූලික අයිතිවාසිකමක් උල්ලංඝණය කිරීමක්. හැබැයි, මේකට එකතු කළා නම්, මේ අය කම්කරු තනතුරකට, විභාගයකට පෙනී සිටීමට සුදුසුකමක් කරලා අරගෙන - අපේ පාසල්වල විශාල වැඩ තිබෙනවා. ඉස්පිරිතාලවල විශාල වැඩ තිබෙනවා. ඇඳන් ටික රෙපෙයාර් කරන්න, වැල්ඩින් කරන්න, එහෙම නැත්නම් විදුලි පද්ධතිය හදන්න, මේ වාගේ නොයකුත් වැඩ තිබෙනවා. ඒ අයට මසක කාලයක් මේ වාගේ පුහුණුවක් දීලා උසස් පෙළට පෙනී සිටීම සුදුසුකමක් කියලා අරගෙන ඒ අයගෙන් වැඩි සේවාවක් ගන්න විධියට දාන්න පුළුවන් නම් ඒ අයට ගෞරවයකුත් ඇති වෙනවා. කවුරුත් රැකියා දෙනවා නම් අර වාගේ දෙයක් ඉගෙන ගන්න අකමැති වෙන්නේ නැහැ

නේ? එහෙම නැත්නම් වෙනත් අතකින් වෘත්තීය සුදුසුකමක් තිබෙන්න ඕනෑ කියලා නීතියක් ගේනවා නම් ඒත් සාධාරණයක් තිබෙනවා. නමුත් අපේ රටේ සංවර්ධනයට, අපේ රටේ ජවයට අවශ්‍ය සම්පත් මේ ආකාරයෙන් එකතු කරගන්න ගියොත් කම්කරු තනතුරක් දෙන්න අනාගතයේදී මනුස්සයෙක් නැතුව යනවා. ඒ වාගේම අර පිරිස. අට සමත් පිරිස, නැත්නම් O/L දක්වා ඉගෙන ගත් පිරිස පාදඩ සමාජයට එකතු වීමේ ලොකු විකල්ප ක්‍රමයක් ඇති වෙනවා. ඒ මිනිස්සුන්ව රජය ගණන් ගන්නෙත් නැහැ. රජයේ රැකියාවක් කරන්නත් බැහැ. ඒ මිනිස්සුන්ට ගෞරවයක් ඇති රස්සාවක් ලැබෙන්නෙත් නැහැ. ඒක නිසා ඒ අය අද අපේ රටේ තිබෙන මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට, පාතාලයට එකතු වෙන්න, එකතු කරන්න හේතුවන දෙයක් කියන එකයි මම මේ වෙලාවේ කියන්නේ.

ඒක නිසා මම හිතන්නේ, ඒ අයත් වටිනා පිරිසක් හැටියට අරගෙන ඒ අයට ඒ ඒ විෂයයන්ට අදාළව වෘත්තීය පුහුණුවක් දීලා, කම්කරුවෙක් හැටියට කරන සේවය උසස් කරන්න ක්‍රමයක් සකස් කරනවා නම්, මම හිතන්නේ එය වටිනා කාරණයක්. එහෙම නැතුව, ඒ අය අදක්ෂයෝ හැටියට පිටුපාලා, ඒ අයව සමාජයේ අගාධයට තල්ලු කරන මේ වාගේ යෝජනා මම නම් තරයේ ප්‍රතික්ෂේප කරනවා. ඒක නිසා කෙටියෙන්ම කිව්වොත් මේ අයත් වටිනාකම් තිබෙන මිනිස්සු. අපි මිනිසුන්ගේ වටිනාකම් වැඩි කරන්න මිසක් වටිනාකම් අඩු කරන්න කටයුතු කරන්න නරකයි. අපි දන්නවා. අපි පාසල් යන කාලේ ගණන් සමත් වෙන්න හරි අමාරුයි. මට මතකයි මම පළමුවැනි වටයේ විභාගයේදී ගණිතය Fail වුණා. නමුත් අපව පැත්තකට විසි කරලා දැම්මා නම් ඊට පස්සේ අපට වටිනාකමක් එන්නේ නැහැ නේ? ඒ වාගේ තත්ත්වයකින් හෝ ඒ අයව උනන්දු කරන එක, Promotion දීමේදී ඒ වාගේ දෙයක් බලනවා කියන එක වෙනම දෙයක්. ඒක නිසා මම හිතනවා රජයක් වශයෙන් ගත්තු, එහෙම නැත්නම් නිලධාරීන් වශයෙන් ගත්තු සමාජයට අහිතකර තීන්දුවක් මේක. තවත් පිරිසක් ලොකු පාතාලයකට තල්ලු කර දැමීමේ නීතියක් මේක. ඒක නිසා අපේ රටේ සම්පත් දායකයින් වන මේ පිරිසගෙන් කම්කරු තනතුරුවල වඩාත් අභිමානයෙන් යුතුව වැඩ කරන්න පුළුවන් විධියේ ක්‍රමවේදයක් සකස් කරනවා මිසක් මේ 6 යි 2 කියන කඩඉම සුදුසු දෙයක් නොවෙයි කියන එක මම කියනවා. අනිවාර්යයෙන්ම මේ නීතිය ඉදිරියට ක්‍රියාත්මක වී ගෙන ගියොත් කම්කරු තනතුරු, මුරකරු තනතුරු, සනීපාරක්ෂක සේවා තනතුරු මේ ඔක්කොම රජයේ ලොකු නිලධාරීන්ට තමයි කරන්න සිද්ධ වෙන්නේ. ඒක නිසා නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට සහාය පළ කරමින් මම නිහඬ වෙනවා. මේ පිළිබඳව බුද්ධිමත් තීරණයක් ඉහළින් ගනියි කියන එක මම බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී මෙම සභාව උදෑසන තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.34 ට යළිත් රැස් විය.***
*Sitting, accordingly suspended until 11.34 a.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට අවස්ථාව.

[පූ.භා 11.35]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මුලින්ම මගේ ස්තූතිය පුද කරනවා. අපි දන්නවා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සමත් නොවෙන විශාල තරුණ පිරිසක් අපේ රටේ ඉන්නවා. ඒ වාගේම අපේ රටේ අධ්‍යාපන ක්‍රමය ගත්තාම, උපාධි ලබාගත්තු විශාල පිරිසක් තමන්ගේ උපාධියත් සමග ඒකරාශී වෙලා, තමන්ගේ අයිතිවාසිකම් දිනාගෙන අද ඔවුන්ගේ රැකියා සියල්ල සම්පූර්ණ කර ගන්න ඔවුන්ට පුළුවන්කම ලැබිලා තිබෙනවා. වත්මන් රජයේ වැඩ පිළිවෙළත් එක්ක ඒ වැඩ කටයුතු සම්පූර්ණ වී තිබෙනවා. ඒ වාගේම තමයි අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල අඩුවෙන් ගන්න තරුණ තරුණියන්ට උදා වෙන ගැටළුව. අද කම්කරුවන් බඳවා ගැනීම සඳහා රජයේ වැඩ පිළිවෙළ යටතේ සුදුසුකම් වෙනස් කරලා තිබෙනවා. ඒ සුදුසුකම් වෙනස් කිරීමේදී කම්කරුවෙක් සඳහා ගණිතය සමග වැඩ 6 ක් සමත් වෙන්න අවශ්‍යතාවය තිබෙනවා. මේ විධියට සුදුසුකම් පරීක්ෂා කරන්න යනකොට විශාල පිරිසකට රැකියා අවස්ථාව අහිමි වෙන්න පුළුවන්. අපි

[ ගරු ජනක වැලිවත්ත]

දන්නවා මේ රටේ විභාගයට මුහුණ දෙන පිරිසගෙන් 50% කට අඩු පිරිසක් තමයි ගණිතය සමත් වෙන්නේ. කම්කරුවෙකුටත් ඒ සුදුසුකම් ඉල්ලා සිටියාම අපේ රටේ රාජ්‍ය සේවයට අවශ්‍ය කරන කම්කරුවන් ප්‍රමාණය සොයා ගැනීමේදී ගැටළුවක් ඇති වෙනවා. ඒ වාගේම විශාල පිරිසක් අසාධාරණයට පත් වෙනවා. මොකද, වැඩ 6 කුත් සම්මාන 2 ක් තිබෙනවා නම්, ඒ අය උත්සාහ කරන්නේ කම්කරු රැකියාවක් සඳහා නොවෙයි. ඊට වඩා ඉදිරියට ගිය රැකියාවක් සඳහා අවස්ථාව ලබා ගන්න තමයි උත්සාහ ගන්නේ.

ගරු සභාපතිතුමනි, අපි ළඟට රැකියාවන් සොයාගෙන එන අපේ තරුණ තරුණියෝ විශාල පිරිසක් බලාපොරොත්තු වෙන්නේ, කළමනාකරණ සහකාර සේවයේ, එහෙම නැත්නම් පරිගණක කටයුතුවල යෙදෙන්න. ඒ වාගේ උසස් රැකියාවක් බලාපොරොත්තු වෙනවා. ඒ වාගේ කෙනෙක් ඒ රැකියාවට යොමු කරනකොට විභාගයෙන් සියලු වැඩ සමත් වෙලා, ගණිතය, ඉංග්‍රීසි සම්මාන සහිතව තිබෙන්නේ ඕනෑ. සමහර අවස්ථාවල ඒ වාගේ සුදුසුකම් තිබෙන අය අඩු වෙන්න පුළුවන්. විශාල පිරිසක් සමත් වෙනවා. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත් වෙනවා. ඒ තුළට කම්කරුවන් ඇතුළත් කරන්න යෑමේදී එලෙස විභාග ප්‍රතිඵල ඇතුළත් කිරීම මම හිතන්නේ සුදුසු දෙයක් නොවෙයි කියලා. මොකද, ඒ සුදුසුකම නැතිව රජයට සේවය කරන්න පුළුවන් හැකියාවක් තිබෙන කම්කරුවන් ඕනෑ තරම් සිටිනවා. අද පාසල් කටයුතුවලදී, සෞඛ්‍ය කටයුතුවලදී වෙනත් ආයතනවලත් කම්කරුවන්ගේ සේවය ඉතා වටිනාකමක් තිබෙන සේවයක්. මේ සේවය ලබා ගන්න හොඳ අධ්‍යාපන ප්‍රතිඵලයක් තිබෙන කෙනෙක් ඒ තනතුරට පත් කළොත් ඔහු එම ආයතනයේ රැකියාවට ගිහිල්ලා බලාපොරොත්තු වෙන්නේ, කම්කරු රාජකාරිය කරන්න නොවෙයි. ඔහු එහි ඉඳගෙන බලාපොරොත්තු වෙන්නේ, කාර්යාල කටයුතුවල යෙදෙන්න. ඒ පිළිබඳව තමයි ඔහුගේ මානසිකත්වය ඇති වෙන්නේ. ඒ නිසා අපේ රාජ්‍ය සේවයට විශාල ශක්තියක් දෙන්න පුළුවන්, විශාල තරුණ පිරිසක් මෙකේදී අසාධාරණයට ලක් වෙනවා. කලින් තිබුණ ක්‍රමය අනුව අට ශ්‍රේණිය විභාගය සමත් වෙලා තිබුණා නම් කම්කරුවෙක් වශයෙන් බඳවා ගැනීමේ හැකියාව තිබුණා. නමුත් අද මේ සඳහා විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මම පෞද්ගලිකවම දන්නවා. පසුගිය මාසය තුළ හෝමාගම, පිටිපන මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ ගෙවත්ත සඳහා ස්ථිර පත්වීම් දීලා කම්කරුවෝ දෙදෙනෙක් අධ්‍යාපන අමාත්‍යාංශයට ගන්න උවමනා වුණා. ඒ කම්කරුවන් දෙදෙනා සඳහා උවමනා වුණු සුදුසුකම තමයි මේ කියන වැඩ 6 ක් සමත් වෙලා, සම්මාන 2 ක් සහිතව එන්න ඕනෑ. අපි හෝමාගම ආසනය පුරාම මේ සුදුසකම් සහිතව කම්කරුවෝ දෙන්නෙක් හෙව්වා. මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ පාසල් ගෙවත්තේ කටයුතුවලට ඇතුළත් කරන්න. නමුත් ඒ සුදුසුකම් තිබෙන කිසිම තරුණයෙක් ඒ සඳහා ඉදිරිපත් වුණේ නැහැ. තමන්ගේ කැමැත්ත ප්‍රකාශ කළේ නැහැ. ඒ සුදුසුකම් තිබෙන. කම්කරුවන් එවැනි රැකියා සඳහා ඉදිරිපත් කරන්න ඕනෑ වෙනකොට මේ තුළින් විශාල ගැටළුවක් මතු වෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඉතින් මට කිව්වා නම් දෙනවා නේ?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

හෙව්වා, හැම තැනම. සොයා ගන්න බැරි වුණා. හෝමාගමින් බැරි වෙලා අන්තිමට සේවයට ඇවිල්ලා තිබුණා, රත්මලාන මැතිවරණ කොට්ඨාශයේ දෙදෙනෙක්. ඒ වාගේම තමයි තවත් පිරිසක් ඉන්නවා පසුගිය දවස්වල මේ ආයතනවල සේවය සඳහා ඇතුළත් වෙලා. විශේෂයෙන්ම පෙළපොත් ගබඩා සංකීර්ණ වාගේ ඒවායේ කම්කරු රැකියාවල ඉන්න අයට තමන්ගේ සේවය ස්ථිර කර ගැනීමට මේ අවස්ථාව වනකොට අවස්ථාව ලැබිලා තිබුණත් ගැටලු ඇති වෙලා තියෙනවා. මොකද, ස්ථිර කර ගන්නකොට අද සුදුසුකම් වශයෙන් ඉල්ලනවා, වැඩ 6 යි සම්මාන 2 ක් සමත් වෙන්න ඕනෑ කියලා. එලෙස සුදුසුකම්. ඒ ඉල්ලනකොට වසර ගණනාවක් අනියම් කම්කරුවන් වශයෙන් සේවය කරමින් ඉන්නේ. මේ නිසා සේවය ස්ථිර කරන අවස්ථාවේදී ඔවුන් ඉතාමත්ම අසරණ තත්ත්වයකට පත් වෙලා ඉන්නවා. ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් නොමැතිකම නිසා. ඒ නිසා අද පළාත් සභා වශයෙන් මෙහිදී යෝජනා කරන්නේ, ඔබතුමන් හරහා වත්මන් රජයට ගෙනිහිල්ලා මේ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව නැවත සලකා බලන්න කියලයි. මොකද, අපේ රටට විශාල සේවයක් කරන්න පුළුවන්, තාරුණ්‍යයේ ජවය ඇඟේ තිබෙන, රැකියාව වෙනුවෙන් තමන්ගේ ශක්තියෙන් කටයුතු කරන්න පුළුවන් විශාල පිරිසකට මේ සඳහා අවස්ථාව අහිමි වන නිසා ඔවුන් නිකමුන් බවට පත් නොකර ඒ අවස්ථාව ඔවුන්ට උදා

කර දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඔවුන්ට රජයේ රැකියාවක් නොලැබුණොත් සමහර වෙලාවට පෞද්ගලික අංශයෙත් කරන්න වෙන්නේ ඊටත් වඩා අසහන රැකියාවක්. ඒ නිසා ඔවුන් ඒ තත්ත්වයට පත් නොකර නැවත වරක් මේ පිළිබඳව සිතා බලා සියලුම දෙනාට මේ සඳහා ඇතුළත් විය හැකි පරිදි සුදුසුකම් සංශෝධනය කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

[පූ.භා 11.43]

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් තමුන්නාන්සේට ස්තූතිවන්ත වෙනවා. අපේ නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවමින් ඉතාමත්ම කාලෝචිත යෝජනාවක් මේ සභාවට රැගෙන විත් තිබෙන්නේ ගරු සභාපතිතුමනි, මම දන්නා පරිදි මේ රටේ විශාල - උදාහරණයකට ගත්තොත් ත්‍රිවිධ හමුදාව තුළ තිබෙන අධ්‍යාපන සුදුසුකම මොකක්ද කියලා හිතලා බැලුවොත් යම් අවබෝධයක් ලබා ගන්න පුළුවන්. ත්‍රිවිධ හමුදාවට බඳවා ගන්නා සියලු දෙනා රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් බඳවා ගන්නේ රාජ්‍ය සේවයට. මේ රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී අධ්‍යාපන සුදුසුකම් මොනවාද කියලා අපි මොහොතක් හිතලා බලන්නට ඕනෑ. මොකද, අපි පත්තරවල දකිනවා. මේක ලැජ්ජාවට කාරණාවක් නොවෙයි. මේක අවමානයට කාරණයක් නොවෙයි. අපි පත්තරවල දකිනවා, සාමාන්‍ය සෙබලෙක් බඳවා ගන්නකොට අට සමත්වීම තමයි රජයේ ප්‍රතිපත්තිය විධියට ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. අපි දන්නවා. ත්‍රිවිධ හමුදාවේ පමණක් නොවෙයි, සියලුම රාජ්‍ය ආයතනවල තුන ශ්‍රේණියේ කම්කරුවෝ වශයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ සේවය කරන පිරිසක් ඉන්නවා. ඒ විතරක් නොවෙයි. කම්හල්කරුවෝ, ඊළඟට පාවහන් නඩත්තුකරුවෝ, උද්‍යාන කම්කරුවෝ, සනීපාරක්ෂක කම්කරුවෝ මේ ආදී වශයෙන් රාජ්‍ය සේවයට අන්තර්ගත වෙලා ඉන්නවා අඩු අධ්‍යාපන මට්ටම්වල සිටින පුද්ගලයෝ. මම හිතනවා ගරු සභාපතිතුමනි, අපි මේක දකින්නට ඕනෑ බොහොම සුභවාදී විධියට. මොකද, මේ අඩු අධ්‍යාපන මට්ටම කියන එක මිනිසෙකුට, විශේෂයෙන්ම මේ සමාජයේ ලංකාව වාගේ තැනක, ලංකාව වාගේ සමාජයක මේ අධ්‍යාපන ක්‍රමය තුළත් ගැටළු, ප්‍රශ්න තිබෙනවා. මම සමහර විද්‍යාලවලට ගියාම ඒ විද්‍යාලවල ගුරුවරු, දෙමව්පියෝ එක්ක සාකච්ඡා කරනකොට, දේශන කරනකොට මම පාසලේ ඉන්න විදුහල්පතිතුමාගෙන් සහ ගුරුවරුන්ගෙන් අහන එක ප්‍රශ්නයක් තමයි ගණිතය උගන්වන ගුරුවරයාට මේ අධ්‍යාපන ක්‍රමය තුළ මතක තිබෙන්නේ ගණිතය විෂයය සම්බන්ධව දක්ෂතාවය තිබෙන දරුවෝ හතර පස් දෙනෙකුගේ නම් පමණක් නම්. විද්‍යාව උගන්වන විද්‍යා ගුරුවරයාට මතක තිබෙන්නේ විද්‍යා විෂයය සම්බන්ධයෙන් දක්ෂතාවය තිබෙන, ඒ පිළිබඳව නිපුණත්වයක් තිබෙන අනාගතයේ O/L පන්තියේදී විද්‍යාවට B එකක් ගන්න පුළුවන්, A එකක් ගන්න පුළුවන් ප්‍රමාණයේ ධාරණ මතක ශක්තියක් තිබෙන දරුවන්ගේ නම් අතලොස්සක් පමණක් නම්. ඒ විතරක් නොවෙයි. මේ සකල විධ අධ්‍යාපන ක්‍රමයම ලැහැස්ති වෙලා තිබෙන්නේ මේ ක්‍රමයට. පළමුවැනියා, දෙවැනියා, තුන්වැනියා, හතරවැනියා, පස්වැනියා ජයග්‍රහකයා සොයන අධ්‍යාපන ක්‍රමය අපේ රටේ ස්ථාපිත වෙලා තිබෙන්නේ. පළමුවැනියා, දෙවැනියා, තුන්වැනියා, හතරවැනියා, පස්වැනියා ජයග්‍රහකයාට තමයි, දක්ෂයාට තමයි අපේ රටේ අධ්‍යාපන ක්‍රමයේ මූලිකත්වය රැගෙන ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ යන අධ්‍යාපන ක්‍රමය තුළ මේ රටේ අධ්‍යාපනයකින් තොර වූ යම්කිසි මට්ටමකින්, රට හෝ සමාජය පිළිගන්නා වූ අධ්‍යාපන මට්ටමකින් අඩු විශාල පිරිසක් මේ රටේ අධ්‍යාපනයේදී බිහි වෙනවා. මේක ඉදිරියට ප්‍රභාකරන්ටත් වඩා ලොකු ගැටළුවක්. L.T.T.E ත්‍රස්තවාදයටත් වඩා විශාල ගැටළුවකට, මම හිතන්නේ අනාගතයේදී අපේ රටට මුහුණ දෙන්නට වෙනවා.

ඒ නිසා මේකේ සුභාවදීත්වය මම දකින්නේ ගරු සභාපතිතුමනි, ගණිතය විෂයය හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විෂයයේදී යම්කිසි සුදුසුකමක් රාජ්‍ය සේවයට තිබෙන්නට ඕනෑ. නමුත් රාජ්‍ය සේවයේ රැකියාවල එක එක මට්ටම් අපි මේ රටේ නම් කරලා තිබෙනවා. කම්කරු ශ්‍රේණිය, විධායක ශ්‍රේණිය, පරිපාලන සේවය I, II, III ආදී වශයෙන්. I, II, III කම්කරු ශ්‍රේණියේ රැකියාවලට බඳවා ගැනීමේදී රාජ්‍ය යාන්ත්‍රණය තුළ, අපි හිතනවා මේ සඳහා ගණිතය විෂයය හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත්වීම සුදුසුකමක් සේම සැලකිය යුතු නැතෙයි කියලා. මොකද, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ගණිතය විෂයය, ඒ වාගේම සිංහල විෂයය අසමත් වෙලා මේ රටේ ඉදිරියට යන්න ඉන්න විශාල ශ්‍රම බලකායක් ඉතිරි වෙලා ඉන්නවා. අපි මතක් කරලා දෙන්නට ඕනෑ. වි ශේෂයෙන්ම අද අපි සමාජගත වෙලා

[ ගරු ප්‍රදීප් පෙරේරා]

තිබෙන - අපේ සහෝදර ත්‍රීවිල් රියදුරන් ළඟට ගිහිල්ලා කථා කරලා බැලුවොත් ඇත්ත වශයෙන්ම සමහර අවස්ථාවල අධ්‍යාපනයේ ඉහළ මට්ටම්වල අය තමන්ගේ දෛවය අනුව එතැන සිටින්නට පුළුවන්. නමුත් විශාල වශයෙන් අපි සාකච්ඡා කරලා ඔවුන් හමු වෙලා බලනකොට ඔවුන් තුළ තිබෙන්නේ අඩු අධ්‍යාපන මට්ටම. අපි ළඟට රැකියාවක් සොයාගෙන එන සියලු දෙනා එන්නේ අධ්‍යාපන මට්ටමෙන් අඩු, ඒ වාගේම අසරණ වෙලා. ඒ නිසා අපට දෙන්නට පුළුවන් රැකියා අවස්ථා තිබෙන්නේ මොනවාද? අපට දෙන්නට පුළුවන් වෙන්නේ අනධ්‍යයන කාර්ය මණ්ඩල හෝ කම්කරු වෘත්තියේ රැකියාවක්. ඒ නිසා පළාත් සභාවක් විධියට ගරු සභාපතිතුමනි, මම ඔබතුමා හරහා නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට එකඟත්වය පළ කර සිටිනවා. මේ තිබෙන අධ්‍යාපන මට්ටමේ සිට අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ගණිතය සහ සිංහල විෂයය ගැන එතරම් ලොකු Consideration එකක් කරන්නේ නැතුව අපි මේ රැකියා අවස්ථාව ලබා දීමේදී අපේ රටේ ජීවත් වන අහිංසක තරුණයන්ට රජයේ රැකියාවකට එන්නට අවස්ථාව දෙන්නට ඕනෑ නම් මෙතැනින් පල්ලෙහාට ඇවිල්ලා, අපි කලින් දුන්න පරිදි මෙතුවක් කාලයකට රැකියා ලබා දෙන පිළිවෙතට අනුව මේ කටයුතු ඉෂ්ට සිද්ධ කරන්නට ඕනෑ කියන එකඟතාවය පළ කරනවා. මෙතුමාගේ යෝජනාව කාලෝචිතයි. එතුමා සමාජයට හිතෛෂී පුද්ගලයෙක් විධියට, සමාජයේ අඩු අධ්‍යාපන මට්ටම දරන, අඩු සමාජ මට්ටම දරන පුද්ගලයෝ වෙනුවෙන් තමුන්නාන්සේ ගෙනාපු යෝජනාවට ගෞරවය පුද කරන ගමන් මම ඔබතුමාගේ යෝජනාවට එකඟ වන බව ප්‍රකාශ කරමින් නිහඬ වෙනවා. ස්තුතියි.

[පූ.භා 11.50]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අපේ නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා බස්නාහිර පළාත් රාජ්‍ය සේවාවේ කම්කරු ශ්‍රේණියට බඳවා ගැනීම සම්බන්ධයෙන් මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව ගැන වැදගත් අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. අපි මෙහි සැබෑ තත්ත්වය සලකා බලමු ගරු සභාපතිතුමනි. අපේ අධ්‍යාපනය, නිදහස් අධ්‍යාපනය බවට පත්වීමත් එක්ක මේ රටේ සාක්ෂරතාවය ඉතා ඉහළ අගයකට පත් වුණා. ඒ එක්කම අධ්‍යාපනය ලබන සංඛ්‍යාව වැඩි වීමත් එක්ක උසස් සමාජ තත්ත්වයන්වලට ගමන් කරන්න අපේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පුළුවන්කම ලැබුණා. අද මේ තිබෙන යෝජනාවෙන් කියන්නේ, සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටීම පමණක් සුදුසුකමක් විධියට සලකලා, ඒ අය කම්කරු සේවයට බඳවා ගන්න යෝජනා කිරීමක්. මෙහිදී අපි සලකා බලන්නට ඕනෑ. රජයක් හැටියට මේ රාජ්‍ය සේවය තමයි සමස්ත ශ්‍රී ලාංකිකයින්ට ගුණාත්මක සේවාවක් සපයන සේවාව. ඒ වාගේම ජනතාව බලාපොරොත්තු වන පරිදි ජනතාවට වග කියන වැදගත් සේවාවක් තමයි මේ රාජ්‍ය සේවය. එතකොට වසර 20 ක් පමණ තිස්සේ මේ ආණ්ඩුව පවත්වාගෙන ඇවිල්ලා අද 2013 දී මේ රාජ්‍ය සේවාවට කම්කරුවන් ලෙස සාමාන්‍ය පෙළ අසමතුන්ව මේ රාජ්‍ය සේවයට ගන්න ක්‍රමයක් ගැන තමයි යෝජනාවේ සඳහන් කරන්නේ. මෙකේදී අපි කවුරුත් ඒ පිළිබඳව සලකා බලා තිබෙනවාද කියලා අවධානය යොමු කරන්න ඕනෑ. මේ මෑතකදී තමයි උපාධි ලබපු අයට, රැකියා නැතිව හිටපු අයට උපාධි පත්වීම් රු. 10,000/- ක මූලික වැටුපක් එක්කලා උපාධිධාරීන්ව බඳවා ගනු ලැබුයේ. උපාධිධාරීන්ව අවස්ථා කිහිපයකදී මෙලෙස බඳවා ගත්තා. එතකොට වසර ගණනක් උපාධියක් ලබලා රැකියාවක් නැතිව හිටපු අයට තමයි ඒ රැකියා දුන්නේ.

ඒ එක්කම ගරු සභාපතිතුමනි, උසස් පෙළ සමතුන්ට රජයේ රැකියා අවස්ථා මොනවාද විවෘත වෙලා තිබෙන්නේ? ඒගොල්ලන්ට ලබා දීලා තිබෙන අවස්ථා මොනවාද? කියන එකත් අපි සැලකිල්ලට ලක් කරන්න ඕනෑ. ඒ එක්කම සාමාන්‍ය පෙළ සමතුන් රාශියක් ඉන්නවා. මේ අයට රජයේ ලබා දීලා තිබෙන අවස්ථා මොනවාද කියන එකත් සැලකිල්ලට භාජනය වෙන්නට ඕනෑ. අධ්‍යාපනයක් ලබලා සුදුසුකම් තිබෙන අය කිසිම රැකියාවක් නැතිව ගෙදර ඉන්න කොට, මේ අසමතුන්ට රැකියාවක් දෙන එක ගැන තමයි අපි අද කථා කරන්නේ. විශේෂයෙන්ම අපි දකිනවා, රාජ්‍ය සේවයේ අනියම් වශයෙන් බඳවා ගත් සේවකයෝ රාශියක් ඉන්නවා. ස්ථිර පත්වීමක් නැතිව. ඒ කියන්නේ, කොයි වෙලාවේ ගෙදර යවයිද කියලා අපි දන්නේ නැහැ. ඉතින් මෙලෙස අවධානය යොමු කරන්න ඕනෑ කරුණු රාශියක් ඉස්සරහා තියාගෙන අපි අවධානය යොමු කරනවා, සාමාන්‍ය පෙළත් අසමතුන්ට රජයේ රැකියාවක් ලබා දීම ගැන.

මෙහිදී අපට පැහැදිලිව විග්‍රහයක් කරන්න පුළුවන්. රටක් ඉදිරියට ගමන් කරන කොට, පවත්වාගෙන යන අවම

සුදුසුකම කියන එක එන්න එන්න වැඩි වෙනවා මිසක් අඩු වෙන්න විධියක් නැහැ. රජයක් ඉස්සරහාට යනවා නම්, රටක් ඉදිරියට ගමන් කරනවා නම්, අධ්‍යාපනය දියුණු වෙනවා නම් මේ සුදුසුකම් අවම වෙන්න විධියක් නැහැ. ඒ එක්කම අපේ ගරු මන්ත්‍රීතුමා කියලා තිබෙනවා, ගණිතය අසමත්ව 50% ක් සාමාන්‍ය පෙළ අසමතුන් බවට පත් වෙනවා කියලා. මේ නිසා තමයි මේ අධ්‍යාපන සුදුසුකම අඩු කරලා රාජ්‍ය සේවයට බඳවා ගන්න යෝජනාව ගේන්නේ කියලා. එතකොට ගරු සභාපතිතුමනි, 50% ක් සාමාන්‍ය පෙළ අසමත් වෙනවා කියන්නේ, අපේ අධ්‍යාපනයේ තිබෙන දුර්වලකමක්. අපි යෝජනාවක් ගේන්න මේ 50% ක් සාමාන්‍ය පෙළ අසමත් වන ශිෂ්‍ය සංඛ්‍යාව සමත් කරන්න ක්‍රමයක් ගැනයි අපේ යෝජනාව ගේන්න ඕනෑ. එහෙම නැත්නම් තව ටිකක් කල් ගියාම මේ මන්ත්‍රීතුමන්ලාම යෝජනා කරන්න පුළුවන් අධ්‍යාපන සුදුසුකමක් අවශ්‍යම නැහැයි කියලා. ඉස්සරහාට රාජ්‍ය සේවයට පමණක් නොවෙයි වෙනත් සේවාවන්වලටත් එහෙම යෝජනා කරාවී. ඉතින් මේ තත්ත්වය ඉතාම කනගාටුදායකයි. අද විපක්ෂයේ මන්ත්‍රීවරු 30 ක් ඉන්න කොට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු 60 ක් ඉන්නවා. එහෙම වුණාම ඕනෑම යෝජනාවක් සම්මත කර ගන්න පුළුවන්කම තිබෙනවා. නමුත් අද ඉතාම කනගාටුදායක තත්ත්වය වන්නේ, මේ රාජ්‍ය සේවයේ තිබෙන ගුණාත්මක භාවය පිළිබඳවයි. කම්කරුවෙකු හැටියට බඳවා ගෙන ඒ කම්කරු රැකියාව කරනවා කියන එක විතරක් නොවෙයි, රාජ්‍ය සේවය කියන්නේ. ඒ ආයතනත් සමඟ සම්බන්ධතාවය පවත්වාගෙන යන්න ඕනෑ. ඉහළ නිලධාරීන්ට ගරුත්වයක් ඇතිව කටයුතු කරන්න ඕනෑ. තමන්ගේ සේවය සපයන පුද්ගලයන්ට ගරුත්වයක් ඇතිව කටයුතු කරන්න ඕනෑ. මෙහෙම ක්‍රමානුකූල භාවයක් නොමැතිව අපි මධ්‍යම රජයට යෝජනා කරනවා නම්, මේ විධියට ශිෂ්‍යයින්ව තනතුරු සඳහා රැකියාවට බඳවා ගන්න කියලා. මේකේ ඉතාම භයානක පැත්තක් තිබෙනවා.

ඉතින් මෙහිදී විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට විවේචනයක් කරනවා නොවෙයි. අපි රජයක් හැටියටත් ඉදිරියට ගමන් කරන රටක් හැටියට අපි කල්පනා කරන්න ඕනෑ, මේ අවම සුදුසුකම් පූර්ණ කර ගන්න මේ ශිෂ්‍යයන්ට අවස්ථාවක් ලබා දෙනවා මිසක්, ඉගෙන ගන්න බැහැ. දැන් විභාගය අසමත් වෙනවා. එහෙම නම් අසමතුන්ට රැකියා දෙන ක්‍රමයක් නොවෙයි. මේ අවුරුදු 20 ක් රජයක් කරපු මේ රජයට අපි යෝජනා කරන්නේ මේ 50% ක් අසමත් වන ශිෂ්‍යයන් සමත් වන ක්‍රමයක් ගැන යෝජනාවක් ගේන්න කියලයි. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Asoka Lankathilaka M.P.C took the Chair.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මීළඟට සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක් තිබෙනවා.

[පූ.භා 11.56]

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම නෙලුක් මල්ලව අපේ සහෝදර ගරු මන්ත්‍රීතුමා ගෙනැත් තිබෙන්නේ, ඉතාම වැදගත් කාලෝචිත යෝජනාවක්. මේ යෝජනාව පළාත් සභාවේ පමණක් නොවෙයි මේ රටටම ක්‍රියාත්මක කරන්න වුවමනා යෝජනාවක් තමයි මේ ගෙනැල්ලා තිබෙන්නේ. අද 50% ක් ගණිතය අසමත් වෙනවා. ඒ 50% ට යන්න තැනක් නැතිව ඉන්න කොට කම්කරු රස්සාවකට ගිහිල්ලා තමයි යන්තම් මේ ජීවිතය ගැට ගහ ගන්නේ. මේ පිරිසටත් තවත් අතුගාලා එළියට දාලා තිබෙනවා. හයයි දෙකක් ගණිතයත් එක්ක තිබෙනවාය කියන්නේ සමහර වෙලාවට හයයි පහ අ.පො.ස(සා.පෙළ) සමත් අය තමයි මේ ඉල්ලලා තිබෙන්නේ. මේක ඉතාමත් ශෝචනීය තත්ත්වයක්. විශේෂයෙන්ම නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා මෙය දැකලා මේ යෝජනාව ගෙනාව එක ඉතාම කාලෝචිතයි. මේ රටේම ක්‍රියාත්මක කරන්න ඕනෑ යෝජනාවක්. නැත්නම් ගණන් අසමත් වුණු අයට යන්න තැනක් නැහැ. මේ අයට කරන්න රැකියාවක් නැතිව, රජයේ රැකියාවක් නැතිව එළියට තල්ලු වෙලා පාතාලයට තල්ලු වන ක්‍රමයක් තමයි මේ තිබෙන්නේ. විශේෂයෙන්ම අපේ පළාත් සභාවේ මේ පිරිස අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ මුරකරු කියලා කොටස් දෙකකට වර්ග කරලා තිබෙනවා.

මුරකරුවෙකුට ආපහු අනධ්‍යයන කාර්ය මණ්ඩලයටවත්, ලිපිකරු තනතුරකටවත්, පියන් තනතුරකටවත් යන තත්ත්වයත් මේ අලුත් නීති මාලාව හමුවේ අහිමි කරලා තිබෙනවා. මුරකරුවෙක් හැමදාම මැරෙනකල්ම මුරකරුවෙක් වෙන තත්ත්වයට තමයි මේ යෝජනා සකස් කරලා තිබෙන්නේ. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මුරකරු කියලා වෙනමම කොට්ඨාශයක් හදලා. හරියට හිරකරුවො වාගේ තමයි මුරකරුවෝ. ඒ අයට මුරකරු රස්සාවෙන් මිදෙන්න පුළුවන්කමක් නැහැ. මේ අලුත් ක්‍රමවේදය අනුව. මම හිතන්නේ, මේකත් සංශෝධනය විය යුතුයි. මුරකරුවකු වශයෙන් ගියා නම් තමන්ට සුදුසුකම් තිබෙනවා නම් ඒ අයට තව ඉහළට යන්න පුළුවන් අවස්ථාව නිර්මාණය කරලා දීමේ වගකීම ආණ්ඩුවක් වශයෙන් අපට තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මුරකරුවන්ට මේ වුණු අසාධාරණයත් නිවැරදි කිරීම සඳහා පියවර ගන්නය කියලා අපි යෝජනා කරනවා. ඒ වාගේම අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අයටත් ඉස්සරහාට යන්න පුළුවන් ක්‍රමවේදයක් තමන්ගේ සුදුසුකම් අනුව සකසා දිය යුතුයි. මම හිතන්නේ, එපමණක් නොවෙයි. අපේ වත්මන් ජනාධිපතිතුමා කම්කරු අමාත්‍යවරයා වශයෙන් මේ රටට විශාල සේවයක් කරපු ඇමතිවරයෙක් ජනාධිපති වෙලා ඉන්න අවස්ථාවේ, කම්කරු අමාත්‍යවරයා හැටියට කම්කරු ප්‍රඥප්ති ගෙනැල්ලා, මේ රටේ කම්කරු අයිතීන් සුරක්ෂිත කරපු නායකයා රටේ ඉන්න වෙලාවේ අපේම ආණ්ඩුවේ නිලධාරීන් මේක අනික් පැත්තට හැරිලා කම්කරුවාට ගහන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද සෞඛ්‍ය අමාත්‍යාංශය ගත්තොත් - අවුරුදු 45 ක් වන තෙක් ඕනෑම සේවකයෙකුට රජයේ රැකියාවකට යන්න පුළුවන්කම තිබුණා. අද එය 35 කරලා පල්ලෙහාට දාලා තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවුරුදු 35 යි දවසක් ගත වෙලා තිබෙනවා නම්, ඒ අයට පත් වීම දෙන්නේ නැහැ. පසුගිය දවස්වල පත්තරේ තිබුණා, උපන්දිනය අනුව අවුරුදු 35 ට වැඩි එක දවසයි. එයාටත් පත්වීම දුන්නේ නැහැ. මෛත්‍රීපාල සිරිසේන අමාත්‍යතුමා, අපේ සන්ධානයේ ලේකම්තුමා. එතුමාගේ අමාත්‍යාංශයේ අවුරුදු 35 ට වැඩි නම් රැකියාවට ගන්නේ නැහැ. බරපතළ අපරාධයක් මේ කරන්නේ. අවුරුදු 35 ක් වන තෙක් රස්සාවක් දීපු නැති එකේ වරද ගන්න ඕනෑ ආණ්ඩුව. ඒ මිනිස්සුන්ගේ වරදක් නොවෙයි. ආණ්ඩුවට පුළුවන්කමක් තිබුණා නම් රස්සාව දෙන්න 45 වන තෙක්, ඒ මිනිස්සු ගෙවල්වලට වෙලා නාකි වෙන්නේ නැහැ. 35 ට පල්ලෙහා අයට තමයි අද රැකියා දෙන්නේ. අවුරුදු 35 ඉඳන් 45 වන තෙක් ඉන්න කට්ටියට සුදුසුකම් තිබුණත්, ඒ අයට රජයේ රැකියාවකට යන්න තිබෙන වරප්‍රසාදය අහිමි කරලා තිබෙනවා. මේක බරපතළ තත්ත්වයක්. අපි පසුගිය අයවැය යෝජනාවලදීත් අතිගරු ජනාධිපතිතුමා ඉස්සරහම කිව්වා මේ රටේ වහල් වෙළඳාමක් සිද්ධ වෙනවා. මේ කොන්ත්‍රාත් අයට, කොන්ත්‍රාත්කරුවන්ට සේවය සපයන්න ඉඩ දීම නිසා. ලිපිකරුවන් කම්කරුවන් සියල්ල කොන්ත්‍රාත් ක්‍රමය තුළ කෙරෙන්නේ. ජල සම්පාදන මණ්ඩලයේ, බැංකුවල නොයෙකුත් ආයතනවල කොන්ත්‍රාත්කරුවන් යටතේ තමයි මේ සේවය සපයා ගන්නේ. කොන්ත්‍රාත් ක්‍රමයට රු. 1000/- ක් කම්කරුවෙකුට ගෙවන කොට රු. 500/- යි දෙන්නේ සේවකයාට. රුපියල් 500 ක් කොන්ත්‍රාත්කාරයන්ගේ සාක්කුවලට යනවා. ඒවායෙන් කොටසක් නිලධාරීන්ට යනවා. මෙවැනි ක්‍රමවේදයකට දහස් ගණනක් ජනතාව අද අතරමං වෙලා තිබෙනවා. මේ අපේ ආණ්ඩුව තුළම. ඉතින් මේවාට වහා පිළියමක් යොදන්න කියලා අපි පසුගිය අයවැයේදී යෝජනා කළා. අපේ ජනාධිපතිතුමා පී.බී. ජයසුන්දර මැතිතුමාට උපදෙස් දුන්නා, මේ කොන්ත්‍රාත් අයට මොකක් හරි වෙනත් සමාගමක් හදලා හරි මේ සියලු දෙනාව ස්ථිර කරන වැඩ පිළිවෙළකට යන්නය කියලා. ජයසුන්දර මහත්තයාට, ලෝකයම දන්න පී.බී. ජයසුන්දර කියලා නමක් තිබෙනවා. නම ලස්සනට තිබුණාට එතුමාගේ හදවත හරියට හිට්ලර් වාගේ. ලෝකයම දන්න පී.බී. ජයසුන්දර මහත්තයාත් හිට්ලර්ගේ වාගේ හදවතින් කටයුතු කරන්නේ. ජනාධිපතිතුමා කියලාවත් මේ කොන්ත්‍රාත්කරුවෝ ටික ස්ථිර කරලා මේ රජයේ සේවයට එක්කහු කර ගන්න එතුමාට කිසිම වුවමනාවක් නැහැ. එවැනි දුර්භාග්‍ය සමයකට මේ රටේ කම්කරුවෝ පත් කරලා තිබෙනවා. ඒ නිසා මේවාට නැවත වතාවක් හිතන්න කාලය ඇවිල්ලා තිබෙනවා. අපට දා ගන්න පුළුවන් කම්කරුවෙකු විතරයි. මේ ක්‍රමය තුළ එයත් අහිමි කරලා තිබෙනවා.

විශේෂයෙන්ම පසුගිය දවස්වල සත්තු වත්තට අලි බලා ගන්න මිනිස්සු ගන්න කොටත් O/L ඉල්ලලා තිබෙනවා. හයයි දෙකක් ඉල්ලලා තිබෙනවා, අලි බලා ගන්න. කවුරුත් ඇවිල්ලා නැහැ. අලි බලන්න අය ඉල්ලලා තිබෙන්නේ, හයයි දෙකයි.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අලි බලන එක අමාරු වැඩක්.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

අලි බලන එක අමාරු වැඩක් වුණාට, හයයි දෙකක් තිබෙන කෙනෙක් අලි බලන්න යන්නේ නැහැ. වෙන මොකක් හරි තිබෙනවා. එහෙම නම් ඒ මනුස්සයා, තව පාරක් A/L කරනවා. මේ වාගේ හිනස්සන වැඩ. මේ ලෝකේ හිනස්සන වැඩ කරන්නේ. මේවා හදන නිලධාරීන් පාර්ලිමේන්තුවල ඉන්න, පළාත් සභාවල ඉන්න අපේ මන්ත්‍රීවරුන්ට මේ කෙටුම්පත් හදලා දීලා අත උස්සවනවා. මේ නිලධාරීන් ඒගොල්ලන්ගේ මට්ටමේ ඉඳගෙන කම්කරුවෝ දිහා බලන්නේ නැතිව ටයි කෝට් දාපු නිලධාරීන් AC කාමරවල ඉඳන් කෙටුම්පත් හදලා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මේක එවලා, පළාත් සභා මන්ත්‍රීවරුන්ට එවලා මේකට අත ඉස්සුවා කියලා සම්මත කර ගන්නවා. මේ ගහන්නේ අපට. අපි ගහන්නේ කාටද? අපව මේ තත්ත්වයට ගෙනාපු අහිංසක කම්කරු ජනතාවට තමයි හැරිලා ගහන්නේ. ඒ නිසා අපට වගකීමක් තිබෙනවා. මේ රටේ 45 දක්වා තිබුණු වයස සීමාව උල්ලංඝනය කරන්න කාටවත් අයිතියක් නැහැ. එතුමා මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා වෙන්න පුළුවන්. අපේ සන්ධානයේ, අපේ නිදහස් පක්ෂයේ ලේකම්තුමා වෙන්න පුළුවන්. එතුමාට බැහැ නීති දාන්න. 35 ට වැඩි අය රස්සාවට ගන්නේ නැහැයි කියලා.

මේ රටේ තිබුණේ 45 සීමාව. ඒ සීමාව ස්ථාපිත කරන්න ඕනෑ. පළාත් සභාවක් වශයෙන් අපි ඉල්ලා සිටින්නේ ඒකයි. අපේ පළාත් සභාවත් ඒ අනුව යන්න හදනවා. ඒවා රේඛීය අමාත්‍යාංශයේ කරන්න පුළුවන්. අනුන් කරන වැරදි අපි කරන්න ඕනෑ නැහැ. අපේ වරද අපි නිවැරදි කරන්න ඕනෑ. මම හිතන්නේ, 45 අයටත් ප්‍රමුඛතාවය දීම තමයි වැදගත්කම තිබෙන්නේ. කම්කරුවෝ ගන්නවා නම්, මේ දාන සුදුසුකම මත ඒ කම්කරුවාට බර උස්සන්න පුළුවන්ද? කිලෝ 25 ක් 30 ක් උස්සන්න පුළුවන්ද කියලා පරීක්ෂණයකුයි කරන්න ඕනෑ. කොරියාවේ රැකියාව කරන කොට කිලෝ 50 ක සිමෙන්ති කොට්ටයක් දෙනවා. නැත්නම් වැලි කොට්ටයක් දෙනවා උස්සන්න. අන්න කොරියන්කාරයා රස්සාවට ගන්න හැටි. ඒ සිමෙන්ති කොට්ටේ උස්සන්න පුළුවන් නම් තමයි කොරියාවේ රැකියාවකට යන්න එයාව සමත් කරන්නේ. ඒ සිමෙන්ති කොට්ටේ උස්සා ගන්න බැරි නම්, කිලෝ 50 ක වැලි කොට්ටේ උස්සන්න බැරි නම් ඒරටට ඇතුළු කර ගන්නේ නැහැ. මේ අපේ ලංකාවේ අය සේවයට ගන්න කොට, එලෙස ක්‍රමවේදයක් තිබෙනවාද? ප්‍රායෝගිකව කම්කරුවෙකු ගන්න කොට එයාගේ ශරීර ශක්තිය බලන්න ඕනෑ. අධ්‍යාපන සුදුසුකම නොවෙයි. එවැනි ක්‍රමවේදයකින් ඒ රටවල් දියුණු වෙලා තිබෙන්නේ ඒකයි. අඩු ගණනේ කොරියන් රැකියා ගන්න දිහාවත් බලලා මේ රටේ කම්කරුවෙකු ගන්න කොට කම්කරුවාගේ ශක්තිය, උස, මහත ඒවා බලලා මීසක් මේ කම්කරුවන්ට ගණන් පාස් එක දාලා මේ මිනිස්සුන්ව රැකියා විරහිත ගොඩට තල්ලු කිරීම වහාම නවත්වන්නය කියලා අපි රජයට බල කර සිටින්න ඕනෑ.

එලෙසම අපේ නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව මේ පළාත් සභාවෙන් මහ ආණ්ඩුවටත් යවන්න ඕනෑ. මේ යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක් හැටියට, යෝජනාවේ තිබෙන හරය අපේ මැති ඇමතිවරුන් සියලු දෙනාට තේරුම් කරලා දීමේ වගකීම අපේ බස්නාහිර පළාත් සභාවට තිබෙනවා. වැඩිම ජනතාවක් නියෝජනය කරන, වැඩිම මන්ත්‍රීවරු නියෝජනය කරන පළාත් සභාව වශයෙන්.

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට උත්තරයක් දීලා මගේ කථාව අවසන් කරන්නම්. එතුමිය කියනවා, අධ්‍යාපන සුදුසුකම් බලන්නේ නැතිව මේවා ගෙනාවාම මේ ක්ෂේත්‍රය කඩා වැටෙනවා. නුසුදුසුකම් එයි කියලා. නමුත් ඔබතුමිය දන්නේ නැතිව ඇති. අර ඔබතුමන්ලාගේ කාලේ තමයි ජනසවි ගුරු පත්වීම් දුන්නේ. අනේ හත් දෙයියනේ, ඊයේ පෙරෙයිදා පළාත් සභාවේ මහ ඇමතිතුමා හමු වෙන්න ටීචර්ලා හය දෙනෙක් ඇවිල්ලා හිටියා. O/L නැතිව. පැන්ෂන් ගිහිල්ලා. පැන්ෂන් එක ගෙවන්නේ නැහැ. දැන් O/L ඉල්ලනවා ගණන් ඇතුව. ගණන් නැතිව හය දෙනයි. පැන්ෂන් එක ගෙවන්නේ නැහැ. මේ අපි දුන්න පත්වීම් නොවෙයි. දෙයියනේ ප්‍රේමදාස මහත්තයා දුන්න පත්වීම්. අපි එහෙම ගුරු පත්වීම් දීලා නැහැ. අපි මේ කම්කරුවෝ ගැන කථා කරන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක තමයි හරියට වැඩ කරන්න කියලා ඔයගොල්ලන්ට කියන්නේ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

අපි හරියට වැඩ කරනවා. ඔබතුමිය බලා ගෙන ඉන්න. හරියට වැඩ කරන්න තමයි මේ උත්සාහ ගන්නේ. හැම එකටම පනින්නේ නැතිව ඉන්න රෝස් මන්ත්‍රීතුමිය. ඒ නිසා එතුමියලාගේ කාලයේ තමයි ජනසවි ගුරු පත්වීම් දීලා, ඔවුන්ගෙන් ජීවිත කාලයම වැඩ අරගෙන පැන්ෂන් එක ගන්න ගියාම ඒක ගන්නත් බැහැ. දැන් හය දෙනෙක් පෝලිමේ O/L නැතිව. එවැනි පත්වීම් දුන්නේ ජනසවියෙන්. අපේ ආණ්ඩුවෙන් නොවෙයි. අපේ ආණ්ඩුවෙන් පත්වීම් දීම ඉහළ තලයකට ගේන්න තමයි මේ ක්‍රමවේද හදලා තිබෙන්නේ. නමුත් මේ ක්‍රමවේදය වැරදියි. නැවත වතාවක් අපේ නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමාට අපේ ගෞරවය, ප්‍රණාමය පුද කරමින් O/L ගණන්වලින් කම්කරුවන් ගන්න එක වහාම අත්සිටුවන ලෙසත්, 45 සීමාව සුරක්ෂිත කරන ලෙසත්, මේ සියලුම කොන්ත්‍රාත් කම්කරුවන් එලෙසම අනධ්‍යයන කාර්ය මණ්ඩලවල සහ අනියම් කොන්ත්‍රාත් සියලු සේවකයන් මේ රාජ්‍ය ආයතනවල ඉන්න අපේ කම්කරු නායකයා අපේ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව යටතේ සියලු දෙනා ස්ථිර කරන්නය කියන ආයාචනය කරනවා. සියලුම කම්කරුවන්ගෙන් සහ අනෙකුත් තනතුරුවල ඉන්න සියලු දෙනා රාජ්‍ය ආයතනවල දැන් අවුරුදු ගණන් වැඩ කරන අය ස්ථිර කිරීම සඳහා මුදල් වෙන් කරලා අයවැයෙන් හෝ එයට සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් අපි නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා 12.05]

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs, Probation and Child Care Services and Council Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මේ සභාවේ රීති අත්සිටුවමින් විශේෂයෙන් සාකච්ඡාවට බඳුන් වෙලා තිබෙන්නේ 6/2006 චක්‍රලේඛය ප්‍රකාරව කම්කරු ශ්‍රේණියේ බඳවා ගැනීම් සම්බන්ධ කාරණාවක් පිළිබඳව පවතින අධ්‍යාපන සුදුසුකම් සලකා බැලීම පිළිබඳවයි. විශේෂයෙන් එම තනතුරු සඳහා අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විෂයන් හයක් සමඟ සම්මාන සාමාර්ථයන් දෙකක අවශ්‍යතාවය පිළිබඳව තිබෙන ඉල්ලීම නිසා පැවත තිබෙන අර්බුදකාරී තත්ත්වය නිසා තමයි මම හිතන්නේ, අද අපට මේ පිළිබඳව විශේෂයෙන් කථා කරන්න අවස්ථාව යෙදුනේ. හැබැයි, 2012.09.27 වන දින ගැසට් පත්‍රයේ නිවේදනය කරන මේ චක්‍රලේඛයේ ගණිතය පිළිබඳව සඳහනක් වෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙහිදී ඉල්លුම් කරන්නේ, අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුළු විෂයයන් හයක් සමත් වී තිබීම කියන ඉල්ලීම පමණයි. මෙකට ගණිතය සඳහනක් නැහැ. එතකොට අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත් වීම ලෙස අද සලකන්නේ ගණිතය සහ සිංහල විෂය ඇතුළත්ව වැඩ හය සමත් නම් පමණයි. නමුත් මේක පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් කියන තත්ත්වය නොවෙයි ඉල්ලන්නේ. මොනවා හෝ වැඩ හයක් සමඟ, මොනවා හෝ සම්මාන දෙකක්. නමුත් මම පෞද්ගලිකව දන්නා කාරණාවක්. අපට තිබෙන අත්දැකීම් අනුව. මේ අධ්‍යාපන සුදුසුකම් ඉල්ලීම අවමය අට වන ශ්‍රේණිය සමත් වූ තැන සිට ඒ දක්වාය කියලා ගත්තා නම් ප්‍රශ්නයක් නැහැ. මොකද හේතුව, රාජ්‍ය සේවයට ඇතුළත් වෙන්න තිබෙන අවම - දැන් මේකේ සඳහන් වෙනවා, ශ්‍රේණිගත කිරීම් තුනක්. ඒ ශ්‍රේණිගත කිරීම් අනුව කාර්යාල කාර්ය සහායක සේවයේ - III වන කාණ්ඩයට ඇතුළත් කරලා තිබෙන්නේ, තනතුරු තුනක්. මේකේ පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් වෙන්නේ දුරකථන ක්‍රියාකරු, ලේඛන භාරකරු, පොත් බඳින්නා, අනු පිටපත් යන්ත්‍ර ක්‍රියාකරු සහ ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියාකරු. මේ උසස් වීම් ලේඛනය අනුව. එතකොට මේකේ මේ සේවා කාලය තුළ බඳවා ගැනීම් පටිපාටියේ තුන් වන අදියරේ තමයි කාර්යාල කම්කරු, අමදින්නා, උද්‍යාන කම්කරු, කාර්යාල මුරකරු සහ සනීපාරක්ෂක කම්කරු අහුවෙන්නේ. එතකොට මේ සේවා බඳවා ගැනීම් කාණ්ඩ පහටම ඉල්ලනවා වැඩ හයක් සමග සම්මාන සාමාර්ථ දෙකක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේක එපමණ ගැලපෙන කටයුත්තක් නොවෙයි. දැන් අපි දන්නවා, රෝහල් පද්ධතිය තුළ කම්කරුවන්ගෙන් අපි ගන්නා වැඩ කොටස. සමහර වෙලාවට ඒ අය කරන වැඩ, මේ මිහිමත ජීවත් වන මිනිස්සුන්ට කරන්න බැරි දේවල්. දැන් අපි සාමාන්‍ය කෙනෙකුට, හොඳට ජීවත් වන මනුස්සයෙකුට අපි සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හැටියට සමහර වෙලාවට මෙහෙම ඉල්ලීම් කරන්නේ නැහැ. ඒගොල්ලෝ ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙලා සමහර වැඩ කරනවා. නමුත් අපට නියෝගයක් දෙන්නවත්, ඉල්ලීමක් කරන්නවත් බැහැ

ඒ දේවල් කරන්නය කියලා. ඒ තරම් අපහසු ක්‍රියාවන්. ඉතින් මම හිතන්නේ නැහැ, ඒ මානසිකත්වය ගොඩ නගා ගන්න පුළුවන් වෙයි කියලා මේ වාගේ සම්මාන සාමාර්ථ සහිතව අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විෂයයන් සහිතව රැකියාවකට ගිය මනුස්සයෙකුට. එයා හිතන්නේ ඊට වඩා ඉහළ මට්ටමක ඉඳලා. අපි ඉන්දියාවට ගියාම සමහර වෙලාවට ඉන්දියාවේ ත්‍රීරෝද රථ රියදුරු මහත්වරු ඉන්නවා හොඳ දැන උගත් විභාග සමත් වුණු අය. අපට එහෙම අය ඉන්දියාවේදී මුණගැහිලා තිබෙනවා. සමහර වෙලාවට PHD එකක් කරලා තිබෙනවා. PHD එක කරලත් සමහර වෙලාවට ත්‍රීරෝද රථ රියදුරෙකු හැටියට කටයුතු කරනවා. නමුත් ලංකාවේ එවැනි තත්ත්වයක් අද තවම නැහැ. ඒ නිසා මේ මානසිකත්වය, අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයෙන් යම් සමතෙකු හැටියට තිබෙන මානසිකත්වය තුළ මෙවැනි කම්කරු රැකියාවකට, මෙවැනි සනීපාරක්ෂක කම්කරුවෙකු හැටියට ජල අපවාහන පද්ධතිය තුළ සමහර රාජකාරීවල යෙදෙන කොට විඳින්න තිබෙන දුක් වේදනා මේගොල්ලන්ට විඳ දරා ගන්න අපහසු වෙනවා. ඒ නිසා මේ පිළිබඳව නැවත සලකා බලලා මෙහි සංශෝධනයක් සිද්ධ වෙනවා නම්, අතිශයින්ම වැදගත් කාරණාවක් හැටියට මමත් පෞද්ගලිකවම විශ්වාස කරනවා. මොකද හේතුව, මේක ප්‍රායෝගික නොවන කාරණාවක් නිසා.

ඒ එක්කම අපි කවුරුත් විශ්වාස කරන කාරණාවක්. රාජ්‍ය සේවයට ඇතුළත් වෙන්න තිබෙන අවම සුදුසුකම මේක වන නිසා. එතකොට මින් මතු කවදාවත් අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටියත්, මේ සාමාර්ථයන් නැත්නම් රාජ්‍ය සේවයේ පල්ලෙහාම මට්ටමට කිසි දවසක කිසි කෙනෙකුට ඇතුළු වීමේ අවස්ථාවක් මින් ඉදිරියට මේ රට තුළ සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා රාජ්‍ය සේවය උරුම වෙන්නේ, අවම වශයෙන් වැඩ හයයි සම්මාන දෙකක් ගත් පුද්ගලයෙකුට පමණක් බවට පත් වෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම අද යෝජනා කරනවා. මේ ගැසට් නිවේදනය, 2012.09.27මේ චක්‍රලේඛය වහා අත්හිටුවලා පෙර පරිදි - උසස්වීම් ගණවලදී වෙනස්කම් කළාට කමක් නැහැ. අඩුම වශයෙන් සනීපාරක්ෂක කම්කරු කියන තනතුර. මේ අවසාන වශයෙන් පෙන්නුම් කරලා තිබෙන තනතුරු පහෙන් අඩු ගණනේ කාර්යාල කම්කරු, අමදින්නා උද්‍යාන කම්කරු, මුරකරු සහ සනීපාරක්ෂක කම්කරු. මේ කාණ්ඩ තුනවත් අඩු ගණනේ අට වැනි ශ්‍රේණිය සමත් මේ රටේ ජීවත් වන ශ්‍රමිකයන් සඳහා ලබා දෙනවා නම් මේක අතිශයින් වැදගත් කාරණයක් වෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව මගේ අතිශය ගෞරවය පුද කරමින්, අපි පළාත් සභාවක් හැටියට බස්නාහිර පළාත් සභාව ශ්‍රී ලංකාවේ 1/3 කට වැඩි ජනගහනයක් නියෝජනය කරන මේ පළාත තුළ මේ ගැසට් නිවේදනය පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරමින්, මෙය නිවැරදි කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඔබතුමිය මගින් - රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය තමයි මේ ගැසට් නිවේදනය නිකුත් කරලා තිබෙන්නේ. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනින් මේ ගැසට් නිවේදනය නිකුත් කරලා තිබෙන්නේ. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් මේ පිළිබඳව නිවැරදි කිරීමක් අපේක්ෂා කරන ලෙස ඉල්ලා සිටිමින් ඔබතුමියට මගේ ස්තූතිය පුද කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා 12.15]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේක එක පැත්තකින් ගත්තොත් පුදුමාකාර යෝජනාවක්. අපි හිතනවා, බස්නාහිර පළාත් සභාවේ පස්වන සැසි වාරයේ අවසන් යෝජනාව වෙන්නත් පුළුවන්. තිබුණු යෝජනාව නොගෙන - රීති අත්හිටුවලා ගෙනැල්ලා, ඉතාමත් හදිසියි කියලා ගෙනාපු යෝජනාවක්. ඒ නිසා අපි කල්පනා කරනවා, ආණ්ඩුවට පුදුමාකාර හදිස්සියක් තිබෙනවා. මම ගිය සැරේත් ඇහුවා මොකක්ද මේකේ හදිස්සිය? මේ රීති අත්හිටුවන්න රීතිවලම සඳහන් වෙලා තිබෙනවා අත්‍යවශ්‍ය හදිසි කාරණා කියන්න කියලා. ඒ සියල්ල පැත්තක දාලා, රීති අත්හිටුවලා නොවෙයි, රීතිවලට පිටුපාලා හදිසි යෝජනාවක් විධියට ගෙනාවා. දැන් මේ යෝජනාව ආවේ 1994 නම්, එක්සත් ජාතික පක්ෂය අවුරුදු 17 ක් රට පාලනය කරලා, මේ රටේ අධ්‍යාපනයත් විනාශ කරලා, රටේ සංවර්ධනයක් නැතිව ඉන්න කාලයේ මේ ආණ්ඩුව බලයට පත් වුණු පළමුවැනි මොහොතේදී ඔවුන්ට රාජ්‍ය සේවය පවත්වාගෙන යන්න නොහැකි තත්ත්වයක් තිබෙනවා මේ අධ්‍යාපනය කඩා වැටීම නිසා. රාජ්‍ය සේවයට බඳවා ගන්න බැහැ, මේ ප්‍රතිඵල මත. එහෙම නම් මේ යෝජනාව ගෙනාවේ, එහි යම් තර්කයක් තිබුණා. හැබැයි, 1994 ඉඳලා, අවුරුදු 19 ක් රටක් පාලනය කරපු ආණ්ඩුවක් මේ තියෙන්නේ. අවුරුදු 19 ක්.

[ ගරු නලින්ද ජයතිස්ස]

මැද අවුරුදු දෙකක් හැර එක දිගට ජනාධිපති බලයයි, පාර්ලිමේන්තුවේ බලයයි, පළාත් සභාවේ බලයයි සියල්ලම කැටි කර ගත් ආණ්ඩුවක් අවුරුදු 19 කට පස්සේ ගේනවා, රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී O/L සමත් වීම අවශ්‍ය නැහැයි කියලා. 1994 දී O/L ලියපු කෙනෙක් දැන් වයස කීයද? අවුරුදු 35 යි. දැන් තමුන්නාන්සේලාම කිව්වා, රජයේ සේවයට බඳවා ගැනීමේදී අවුරුදු 45 සීමාව අවුරුදු 35 ට බස්සලා කියලා. දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පටන් ගන්න කොට 1994 දී O/L කරපු කෙනෙක් දැන් අවුරුදු 35 යි. ඒ කියන්නේ, දැන් මේ වින්නැහිය වෙලා තිබෙන්නේ මේ පසුගිය අවුරුදු 19 තුළ නේද? කල්පනා කරලා බලන්නකෝ. ඒ නිසා මේ සන්ධාන ආණ්ඩුව වට්ටන්න, සන්ධාන ආණ්ඩුවේ ඝාතකයෝ ඉන්නේ ආණ්ඩුව ඇතුළේම තමයි. තමුන්නාන්සේලා තේරුම් ගන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු. සන්ධාන ආණ්ඩුව වට්ටන්න, සන්ධාන ආණ්ඩුව විනාශ කරන්න - දැන් අධ්‍යාපනයේ බරපතළ අර්බුදයක් තිබෙනවා. මේ අර්බුදයේ ප්‍රතිඵලය හැටියට රාජ්‍ය සේවය පවත්වාගෙන යන්නවත් බැහැ. ඒ නිසා O/L ප්‍රතිඵල පහත දාන්නෝ කියලා රීති අත්හිටුවීමේ යෝජනාවක් ගේන්නේ සන්ධානයේ පාර්ශවකාරී මන්ත්‍රීවරුන්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ශ්‍රී ලංකා එකේ නොවෙයි නේ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒකත් බලන්න කෝ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නොවෙයි. ඒකයි. දැන් කියන්න පුළුවන්ද මේ යෝජනාව ගෙනාවේ පී.බී. ජයසුන්දර මහත්තයා කියලා. මේක ආර්ථික ඝාතකයෝ ගෙනාපු එකක් නොවෙයි. ආර්ථික ඝාතකයෙක් නොවෙයි ගෙනාවේ. සන්ධානයේ ඝාතකයෙක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විදේශ කුමන්ත්‍රණයකුත් නොවෙයි.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

සන්ධාන ඝාතකයෙක්. දැන් යන්නේ කොහාටද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආණ්ඩුව කියන්නේ ආසියාවේ දැනුමේ කේන්ද්‍රය කරනවා කියලා. දකුණු ආසියාවේ නොවෙයි, මුළු ආසියාවේම දැනුමේ හබ් එක කරනවයි කියලා කියන්නේ. ආසියාවේ හබ් එක ගැන කථා කරන අපි, ජනාධිපතිතුමාගේ පුතාගේ මූලිකත්වයෙන් තරුණයන්ට හෙටක් හදන්න, තාරුණ්‍යයට හෙටක් යෝජනා කරන අපි, රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ සීමාව O/L වලින් අඩු කරනවා. මොකක්ද මේ? දැන් බලන්නකෝ. ජනාධිපතිතුමා ගිය සැරේ අයවැය ප්‍රකාශයට පත් කරන කොට පාර්ලිමේන්තුවේ කිව්වේ මොකක්ද? අපේ අය, විශ්ව විද්‍යාල ආචාර්යවරු පයින් ගිහිල්ලා ඉල්ලා සිටියා 6% ක් අධ්‍යාපනයට වෙන් කරන්නය කියලා. ජනාධිපතිතුමා කිව්වා 6% මොකක්ද දැන් අපි 4.1% ක් වෙන් කරලා තිබෙන්නේ කියලා. 4.1% ක් එතුමාගේ වචනය පිළිගනිමුකෝ. පාර්ලිමේන්තුවේ කිව්වේ. මුදල් ඇමතිවරයා ජනාධිපතිවරයා. 4.1% ක් වෙන් කරලත් අපට බැරි නම් O/L වත් උඩට ගන්න, මොකක්ද මේ? එක්කෝ ආණ්ඩුව බොරු කියන්න ඕනෑ. එහෙම නැත්නම් කොතැනද වරද? ඒ විතරක්දැයි දැන් බලන්න. සපිරි පාසල් 1000 හදලා - මම කියන්නේ, අධ්‍යාපනයට මෙපමණ වියදම් කරන ආණ්ඩුවක් ලෝකේම නැහැයි කියලා නේ. හැබැයි මේකේ ප්‍රතිඵලය තමයි රාජ්‍ය සේවයට ඇතුළත් වීමේ අවම සීමාවත් O/L දක්වා පාස් වෙන්න ඕනෑ නැහැයි කියලා යෝජනාවක් බස්නාහිර පළාත් සභාවේ පස්වන සැසිවාරයේ අන්තිම යෝජනාව විධියට සම්මත කරන්න අපි දැන් යනවා. මොකක්ද බේදවාචකය? මම හිතන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට මේකට විරුද්ධ වෙන්න හේතුවක් නැහැ. ඇයි? රට යන්නේ කොහාටද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අධිවේගයෙන් අගාධයට.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අධිවේගයෙන් ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අගාධයට යනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

දැන් කල්පනා කරලා බලන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, (බාධා කිරීම්) අනික් පැත්තෙන් අපි

මේ යෝජනාව බස්නාහිර පළාත් සභාවේ රීති අත්හිටුවලා සම්මත කර ගන්න යන වෙලාවේ, අපේ රටේ අධ්‍යාපනයට විතරක් ඇමතිවරු 17 ක් ඉන්නවා. පළාත් සභාවල 09 යි. ජ්‍යෙෂ්ට ඇමතිවරු තුනයි. කැබිනට් එකේ තුනයි. නියෝජ්‍ය දෙකයි. ඔක්කොම 17 යි. ඇමතිවරු 17 ක් අධ්‍යාපනයට තියාගෙන අපි O/L වල තිබනෙ සීමාව දානවා පල්ලෙහාට. මම හිතන්නේ ඒකයි.

අපි කිව්වේ, මේකට අපට විරුද්ධ වෙන්න හේතුවක් නැහැ. අපේ රටේ ලොකුම ආයතනයක් තමයි, ප්‍රාග්ධන වත්කම් වැඩිම ආයතනයක් තමයි ශ්‍රී ලංකා එයාර් ලයින්ස්. ශ්‍රී ලංකා ගුවන් සමාගම. ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ සභාපතිකම දරන්න පුළුවන් නම් O/L පාස් වුණේ නැති කෙනෙකුට. එයාට පුළුවන් නම් රුපියල් ලක්ෂ පහේ දීමනාවක් මාසිකව ගන්න. ඉතින් අපි මේ කම්කරු සේවයට බඳවා ගන්නා කෙනෙකුගේ O/L සීමාව මොකටද බලන්නේ? ඔහුට පුළුවන් නම් රටේ කෝටි ගණනක වියදමක් එහේ මෙහේ කරන්න. ආදායමක් එහේ මෙහේ කරන්න. O/L පාස් නැතිව. එතුමාට ජනාධිපතිතුමාගේ තිබෙන මස්සිනාකම වෙන එකක්. ඒක අපි පැත්තකින් තියමු කෝ. ජනාධිපතුමාගේ මස්සිනා වීම නොවෙයි නේ ඒකට යන්න තිබෙන සුදුසුකම් කියලා අපි හිතන්නේ. හැබැයි, O/L පාස් නැහැ. (බාධා කිරීමක්) එතුමාට පුළුවන් නම් ඒ තනතුර දරන්න. ඇයි බැරි මේ කට්ටිය බඳවා ගන්න?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඔබතුමා වගකීමෙන්ද කියන්නේ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඇයි බැරි බඳවා ගන්න.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

පාර්ලිමේන්තුවේ හැන්සාඩ් ගත වෙලා තිබෙන්නේ ඒක.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

පාර්ලිමේන්තුවේ හැන්සාඩ් ගත වෙලා තිබෙනවා. මගේ ප්‍රකාශයක් නොවෙයි. පාර්ලිමේන්තුවේ හැන්සාඩ් එකේ. අපේ රටේ වෙළඳ ඇමතිකම කරන්න පුළුවන් නම් O/L නැතිව. වෙළඳ හා පාරිභෝගික කටයුතු ඇමතිකම දරන්න පුළුවන් නම් O/L නැතිව -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඒක ජනතාවගේ කැමැත්ත.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඇයි අපි මේ සීමාවක් දාන්නේ, රෝහලක කම්කරුවෙක් දාන්න O/L අවශ්‍යයි කියලා. අපේ රටේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මේ රටේ ජනාධිපතිවරයෙක් හිටියා නේ O/L නැතිව.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු අට දෙනෙක් ඉන්න පුළුවන් නම් O/L නැතිව, කවර කථා ද මේ අය ගැන. මොකටද අපි සීමාවක් දාන්නේ O/L වලට බඳවා ගන්න. අනාගතයේ අපේ රටේ බස්නාහිර පළාතේ මහ ඇමතිකම දෙන්න පුළුවන් නම් O/L නැති කෙනෙකුට. තව මොකට සීමා? තව මොන සීමාද? අනාගතයේ O/L නැති කෙනෙක් බස්නාහිර පළාතේ මහ ඇමති වන කොට මොන සීමාද?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කවුද ඒ ?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

රටේ ජනාධිපතිවරයෙකුත් හිටියා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අපි දන්නේ නැහැ. එක ඇමතිවරයෙක් කියනවා බස්නාහිර පළාත් සභාවේ. එයා තමයි ඊළඟ මහ ඇමති කියලා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒ නිසා රට යන්නේ මෙහෙමයි. රට යන කොට අපි මොකටද මේ O/L නැති අය රජයේ සේවයට බඳවා ගැනීමට සීමා දාන්නේ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

තාරුණ්‍යයට හෙටක්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

කොහොම වුණත්, දැන් මේ මොන සීමා තිබුණත් උපාධිධාරීන්ට - (බාධා කිරීම්) අහගෙන ඉන්න කෝ පොඩ්ඩක්. අහගෙන ඉන්න කෝ. (බාධා කිරීම්) ඊළඟට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ මොන සීමා දැම්මත් (බාධා කිරීම්) අහගෙන ඉන්න කෝ. මොන සීමාව දැම්මත් උපාධිධාරියාටත් රස්සාව ගන්න වෙන්නේ දේශපාලන පත්වීමෙන් නම් උපාධිධාරීන් කොහොමද ගත්තේ? රුපියල් 10,000/- පත්වීම්. ඒ ගොල්ලෝ තමන්ගේ ආණ්ඩුවේ ආසන සංවිධායකවරයාගේ ලියුම අරගෙන යන්න ඕනෑ පත්වීම ලබාගන්න. ඒ නිසා මේකේ සීමාවක් නැහැ. මේ යෝජනාවෙන් මොකක්ද පේන්නේ? ආණ්ඩුව රෙද්ද උස්සලා නිරුවත පෙන්නලා තියෙනවා. අධ්‍යාපනයත් කඩා ගෙන වැටිලා තියෙනවා. ඒකට හරියන්න අපේ රාජ්‍ය සේවයේ සුදුසුකම් හදමු කියලා. ඕක තමයි ගොපල්ලට හරියන හරක් පට්ටිය. හරක් පට්ටියට හරියන ගොපල්ලෝ. එහෙම තමයි මේක හදන්නේ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ යෝජනාව ආණ්ඩුවට විරුද්ධ යෝජනාවක්. මධ්‍යම ආණ්ඩුවට විරුද්ධ යෝජනාවක්. මේ යෝජනාව දැම්මයි කියලා මොකක්ද කරන්න පුළුවන්? මේක අපි සම්මත කරයි කියලා මොකක්ද කරන්න පුළුවන්? මොකක්වත් කරන්න බැහැ. මේ යෝජනාව නිකම් දාන්න පුළුවන්. වැඩක් වෙන්නේ නැහැ. අඩු තරමේ මධ්‍යම ආණ්ඩුව හොඳ තීන්දුවක්වත් අරගෙන තියෙනවා. අපි කියනවා, බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපනයට වැඩියෙන් වෙන් කළ පළාත් සභාවේ, රටේ ප්‍රමුඛ පළාත් සභාවේ අපි කියනවා, O/L සීමාවත් අඩු කරමුයි කියලා. දැන් කොහොමත් යන්නේ ඒ පැත්තට නේ? ඒ නිසා මේක ගත්තොත් එහෙම මේ ආණ්ඩුවත් අපහසුතාවයට පත් කරන, ආණ්ඩුවේ අධ්‍යාපන සංවර්ධනයේ හබ් එකේ, තාරුණ්‍යයට හෙටක් එකේ නිරුවත පෙන්වන යෝජනාවක්. ඒ නිසා කල්පනා කරලා බලන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රීවරුන්ට මම නැවතත් කියන්නේ, මේ සන්ධානය විනාශ කරන යෝජනාවක්. මධ්‍යම ආණ්ඩුවටත් අභියෝග කරන යෝජනාවක් තමයි බස්නාහිර පළාත් සභාවෙන් මේ සම්මත කරන්න යන්නේ. ඒ නිසා මේ යෝජනාවට විරුද්ධ වෙන්නේ නැහැ. හැබැයි, මේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමාට ස්තුති කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා 12.25]

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීත්තුමියනි, අපේ හිතවත් නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාවක් සලසා දීම ගැන මගේ ස්තුතිය පුද කරන්න කැමතියි. අපේ හිතවත් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා මේ යෝජනාව තමන්ගේ හුදු දේශපාලන අවශ්‍යතාවයන් වෙනුවෙන් ලඝු කිරීම ගැන අපි කනගාටු වෙනවා. දේශපාලනඥයන්ගේ දැන උගත්කම් ගැන කථා කරන කොට මේ රටට නිදහස ලබා දුන් ජාතියේ පියා යැයි අපි ඉතාම ගෞරවයෙන් අදටත් සමරන ඩී.එස්. සේනානායක මැතිතුමාට අ.පො.ස. සාමාන්‍ය පෙළ සහතිකය තිබුණේ නැහැ. ඒ වාගේම ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යවරිය හැටියට ලංකා ඉතිහාසයේ ඓතිහාසික වැඩ කොටසක් ඉෂ්ට කරපු ඒ අපේ ආදරණීය මාතාව, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට අ.පො.ස. සාමාන්‍ය පෙළ උසස් සාමාර්ථයක් තිබුණේ නැහැ. ඒ වාගේම අපි දන්නා තරමින් මම ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ අධ්‍යාපන සහතිකය ගැන අධ්‍යයනයක් කරලා නැති නිසා ඒ ගැන කථා කරන්නේ නැහැ. නමුත් මේ රට පාලනය කළ ඉතාම දීප්තිමත්, කීර්තිමත් නායකයන් ඔය කියන ආකාරයේ අධ්‍යාපන සුදුසුකම් අනුව තමන්ගේ සේවය ඉෂ්ට කරපු අය නොවෙයි. නමුත් ඔවුන්, සමහර උපාධි ලබා ගත්, පශ්චාත් උපාධි ලබාගත්, ජාත්‍යන්තර සහතික ලබාගත් නායකයන්ට වඩා මේ රට මැනවින් පාලනය කළ බව අප නිහතමානීව සඳහන් කරන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීත්මියනි, ආණ්ඩුව යම්කිසි වැරදි ප්‍රතිපත්තියක් රට තුළ ක්‍රියාත්මක කරන්න යෝජනා කරනවා නම්, ඊට විරුද්ධ වීමේ ශුද්ධ අයිතිය මහජන

නියෝජිතයන් හැටියට අපට තියෙනවා. ඉදිරි කාලයේදී ආණ්ඩුව යම් යම් වැරදි තීරණ තීන්දු ගන්නවා නම්, ආණ්ඩුව නිවැරදි මඟට යොමු කිරීමේ වගකීම මහජන නියෝජිතයන් හැටියට අප සතුයි. එසේ නැතිව සිග්නල් කණු මෙන් ඒ සියළුම දේ අනුමත කිරීම අපට ඡන්දය දුන් ජනතාවට අප කරන නිගාවක් හැටියටයි අපි විශ්වාස කරන්නේ. අද මේ නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා මේ කරන්නේත්, එවැනි අභියෝගාත්මක පියවරක්. මේ රටේ නිලධාරිවාදය ආණ්ඩු විනාශ කිරීම සඳහා ඉතා බරපතළ විධියට පෙනී සිටින බව, ඉතිහාසය තුළ අපි දකිනවා. ඒ නිලධාරිවාදය තුළින් ඔවුන් ආණ්ඩුවට ඉදිරිපත් කරන යෝජනා, ගෙඩිය පිටින්ම අනුමත කොට ඉදිරිපත් කිරීමේ කණගාටුදායක තත්ත්වයක් තමයි, මේ ප්‍රතිපත්තිය කියන ඒක අපි සඳහන් කරන්න කැමතියි.

අපේ සෞඛ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ, සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ සාමාන්‍ය කම්කරුවන් ඉටු කරන්නා වූ සේවය අතිශය කියා නිම කරන්න බැරි සේවාවක්. අපට ඒ සේවාව ඉෂ්ට කරලා දෙන ඒ උතුම් මිනිසුන් අධ්‍යාපන සහතිකයකට ලඝු කොට ඔවුන්ට ඒ සේවය සලසන්න ඉඩ නොදෙනවා නම්, එය බරපතළ ජාතික අපරාධයක්. ඒ නිසා කැබිනට් මණ්ඩලය මේ තීන්දුව ගත්තා වෙන්න පුළුවන්. ආණ්ඩුව මෙහෙයවන නිලධාරින් මේ තීන්දුව ගත්තා වෙන්න පුළුවන්. නමුත් මේ තීන්දුව සමස්තයක් වශයෙන් බරපතළ වැරදි සහගත තීන්දුවක් කියන එක, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපි එකහෙලා මේ සභාවේදී ප්‍රකාශ කරනවා කියන ඒක කියන්න ඕනෑ. දැන් කෙනෙකුට කියන්න පුළුවන්, මේක ප්‍රතිපත්ති තීන්දුවක්. මේක රජයේ තීන්දුවක්. මේක වෙනස් කරන්න බැහැයි කියලා. මතක තියා ගන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ ජාතික ව්‍යාපාරයට පින්සිද්ධ වෙන්න අද කැසිනෝ පනත අකුලා ගන්න ආණ්ඩුවට සිද්ධ වුණා. අද ඒක අකුලා ගන්න සිද්ධ වුණා. ගම්මන්පිලලා, චම්පික රණවකලා, රතන හාමුදුරුවෝ, විමල් වීරවංශ වාගේ ජාතිවාදි නායකයන්ට පින්සිද්ධ වෙන්න, කොන්ද කොලින් තියාගෙන මේ කැසිනෝ පනතට විරුද්ධව අදහස් දැක්වීමේ ප්‍රතිඵලයක් හැටියට අද ආණ්ඩුවට සිද්ධ වුණා, ඒ පනත අකුල ගන්න. අද එක්සත් ජාතික පක්ෂය මේවා ගැන මහ ලොකුවට කථා කරනවා. කොළඹ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙක්, විළි ලැජ්ජා නැතුව යූ.එන්.පී. මන්ත්‍රීවරයෙක් යෝජනාවක් ගේනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මොකක්ද යෝජනාව? ගණිකා නිවාස නීති ගත කරන්න කියලා. එහෙම පක්ෂයකට සදාචාරාත්මක අයිතියක් තියෙනවාද මේ රටේ යුක්තිය, සාධාරණය, සදාචාරය වෙනුවෙන් පෙනී සිටින්න. අඩු තරමේ ඒ මන්ත්‍රීවරයා සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂය නිවට වෙලා තියෙනවා, මේ දක්වා තීන්දුවක් නොගන්නට.

[සභාවේ ඝෝෂා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එක්සත් ජාතික පක්ෂය (බාධා කිරීම්) - හරි ආණ්ඩුවේ යෝජනාවක් නේ ඒක. නමුත් එක්සත් ජාතික පක්ෂය කොහොමද විරුද්ධ වෙන්නේ? එක්සත් ජාතික පක්ෂය ඇඳුමක් ඇඳගෙන කොහොමද මේකට විරුද්ධ වෙන්නේ. තමන්ගේ මන්ත්‍රීවරයෙක් ගණිකා නිවාස දාන්න ඕනෑ කියලා, කොළඹ නගරයේ කැසිනෝ හල් අරින්න ඕනෑ කියලා යෝජනාවක් ගෙනාවාම, ඒ මන්ත්‍රීවරයාට විරුද්ධව විනයානුකූලව කටයුතු කරන්න බැරි පක්ෂයක් මේ රටේ සදාචාරය ගැන කථා කරන්නේ කොහොමද කියන එක අපි මේ වේලාවේ මතක් කරන්න කැමතියි. ඒකට උත්තර හැටියට, අහවලා අරම කළා. අනික් එක්කෙනා මෙහෙම කළා. අර සභාවේ මෙහෙම වුණා කියලා -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ වේලාවේදී මේ සභාවේ ගණ පූරණය පිළිබඳව ඔබතුමියගේ අවධානයට යොමු කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

සීනුව නාද කරන්න.

***සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණය ඇති නොවූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය විසින් රැස්වීම තාවකාලිකව අත් සිටුවන ලදින් ඇ.භා. 12.43 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***

*Committee counted, and a Quorum not being present, the Division bells were ordered to be rung.*
*Later quorum not achieved, the sitting temporarily suspended by the Presiding Member in Chair, and it resumed again at 12.43 p.m. with Hon Chairman in the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාව වන විටත්, සභාවේ ගණ පූරණය නොමැති බව පෙනී යනවා. ඒ නිසා නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව අද දින තවදුරටත් විවාදයට ගැනීමට නොහැකි වෙනවා. ඊළඟ සභා වාරය තිබෙන්නේ නොවැම්බර් මස 26 වන දින. එදිනට මුදල් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට තිබෙන නිසා ඊට ප්‍රමුඛත්වය අනිවාර්යයෙන්ම දිය යුතු වෙනවා. ඒ නිසා මෙම යෝජනාව සම්බන්ධ සාකච්ඡාවට එදිනට සභාවේ එකඟතාවය විතරක් ගැනීමට මම අදහස් කරනවා. මෙහිදි මුදල් ප්‍රකාශයට ප්‍රමුඛත්වය ලබා දීම විය යුතුව තිබෙනවා. ඒ එක්කම අනෙකුත් යෝජනා ඉදිරි න්‍යාය පත්‍රයට ඇතුළත් කරනවා. මේ යෝජනාව එදිනට සාකච්ඡාවට ගන්නේ නැහැ. ඡන්දය විමසීම විතරයි.

**ගරු නෙලුක් මල්ලව**
Hon. Neluk Mallawa

ගරු සභාපතිතුමනි, එදිනට පිළිතුරු කථාවකටවත් අවස්ථාවක් නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම ඔබතුමාට දෙන්න ගියොත් ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා අපි මේ විධියටම යමු.

# 12 (1) රීතිය යටතේ කල් තැබීම
ADJOURNMENT UNDER RULE NO.12(1)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*12(1) රීතිය යටතේ " මම දැන් මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.48 ට, 2013 නොවැම්බර් මස 26 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 12.48 p.m till 09.30 a.m, on* 26*.11.2013*